ජීවිතයම එළිය කරන
සංවර්ධන ලොතරැයිය



# ඉසුරුමත් වසරක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය | වාර්ෂික වාර්තාව 2015





# ඉසුරුමත් වසරක්



අප හට ඇතැම් විට අප අසාමාන්‍ය ධෛර්යයකින් යුතුව තවතවත් සවිමත්වීමේ ක්‍රියාදාමයක නිරත වන්නේ යැයි හැඟුනද එය සැබැවින්ම අසාමාන්‍ය තත්ත්වයක් නොවේ. එය ශ්‍රී ලාංකිකයින් වශයෙන් එක්ව නැගී සිටිමින් අප විසින් අත්කර ගත හැකි සහ අත්කරගත යුතු ජයග්‍රහනයකි. අප නිරන්තරයෙන්ම ජනතාවගේ සිහින මත ගොඩනැගුනු ආයතනයක් බව කිසිවිටකත් අමතක නොකළ යුතු වන අතර එවන් සිහින දකින්නන් වෙත වාසනාව උදා කරමින්ද, ප්‍රජාවන් ගොඩනංවමින්ද, මිලියන සංඛ්‍යාත ජනතාවකගේ ජීවිත කෙරෙහි අරුත්බර වෙනසක් සිදුකරමින්ද, අපි ඉදිරියට ඇදෙන්නෙමු. 2015 බොහෝ සිහිනයන් සැබෑ කරගනිමින්ද, වඩාත් යහපත් හෙට දිනක් සඳහා අවැසි බීජ වපුරමින්ද, සම්පූර්ණ කරන ලද වසරක් බව පවසන්නේ නිහතමානී අභිමානයකිනි.

# පටුන


ආයතනික තොරතුරු | 5

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය | 6

සන්ධිස්ථාන | 7

මූල්‍යමය විශේෂතා | 8

සභාපතිවරයාගේ පණිවුඩය | 10

අධ්‍යක්ෂ මණ්ඩලය (2015) | 12

අධ්‍යක්ෂ මණ්ඩලයේ විමර්ශනය | 13

කළමනාකරණ කණ්ඩායම | 14

මෙහෙයුම් විමර්ශනය | 15

තිරසාරත්ව වාර්තාව | 20

සාමූහික පාලනය | 24

අවදානම් කළමනාකරණ වාර්තාව | 26

විගණන සහ කළමනාකරණ කමිටු වර්තාව | 28

**මූල්‍යමය වාර්තා**

ස්වාධීන විගණක වාර්තාව | 30

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 45

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 46

මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 47

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 48

මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන් | 49

දස වසරක සාරාංශය | 69




# අපගේ දර්ශනය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදාකිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත් වීම.

# අපගේ මෙහෙවර ප්‍රකාශය

''නවීන තාක්ෂණය යොදාගනිමින් නවතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයි පත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.''

# අපගේ ඉලක්ක

වෙළෙඳපොළ කොටස වර්ධනය කරගැනීම

ජනාධිපති අරමුදල සඳහා වන දායකත්වය උපරිම තත්ත්වයට පත් කිරීම නවීන තාක්ෂණය අත්පත් කරගැනීම සහ භාවිතය පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම

# අපගේ මූලික වටිනාකම්

**සුපිළිපන්බව**

අප විසින් ඉදිරිපත් කරනු ලබන ලොතරැයි සහ අප ව්‍යාපාරික කටයුතු වල නිරත වන ආකාරය සාධාරණ අවංක සහ විශ්වසනීය වේ.

**සුබවාදී ආකල්පය**

ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුබවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් තුළ පවතී.

**ප්‍රතිඵලදායක බව**

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කරගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති.

**නව්‍යතාව**

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් ව්‍යාපාරික වර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරඟකාරී වෙළඳපළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති.

**කණ්ඩායම් හැඟීම**

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහිලා එකාවන්ව කටයුතු කරති.

**විශිෂ්ටත්වය කෙරෙහි කැපවීම**

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් අඛණ්ඩවම සේවා තත්ත්වයන් උපරිම මට්ටම කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.



# ආයතනික තොරතුරු

**මණ්ඩලයේ නාමය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නෛතික ස්වභාවය**

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පාර්ලිමේන්තු පනත යටතේ මණ්ඩලය සංස්ථාපිතයි

**ආරම්භක දිනය**

1983 ජනවාරි මස 19 වැනි දින

**ලියාපදිංචි කාර්යාලය**

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02

**දුරකථන**

011 2 333 546-8, 011 4 824 824

**ෆැක්ස්**

011 2 333 545

**විද්‍යුත් තැපෑල**

devlottr@slt.lk

**වෙබ් අඩවිය**

www.dlb.lk

**TIN**

409089844

**අධ්‍යක්ෂ මණ්ඩලය (2015)**

1 රොමේෂ් ජයවර්ධන මයා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

2 ආර් අයි විමලසේන මිය - උප සභාපති

3 ඩී එන් නානායක්කාර මයා - අධ්‍යක්ෂ

4 ආචාර්ය වික්‍රම වීරසූරිය - අධ්‍යක්ෂ

5 එම් එස් ඩී රණසිරි මයා - අධ්‍යක්ෂ

**විගණකවරු**

විගණකාධිපති

**බැංකුකරුවන්**

මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව

# සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය

ආරම්භයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය යනුවෙන් හැඳින්වුනු සංවර්ධන ලොතරැයි මණ්ඩලය වසර 1983 ජනවාරි මස 19 වැනි දින ස්ථාපනය කෙරිණි. මෙම මධ්‍යස්ථානයේහි ප්‍රධාන අරමුණ වූයේ රජය වෙත මුදල් සම්පාදනය කිරීමෙහිලා සහාය දැක්වීමයි.

ඉන් අනතුරුව වසර 1993 දී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය 'සංවර්ධන ලොතරැයි භාරය' වශයෙන් පරිවර්තනය කෙරිණි. 1997 අගෝස්තු මස 12 වැනි දින එම භාරය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත යටතේ 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' බවට පත් කෙරිණි.

වසර 1983 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි වෙළඳපළට පිවිසියේ ක්ෂණික ලොතරැයි පත් හඳුන්වාදෙමින් වූ අතර, එමගින් වසර 1987 දී 'ශනිදා වාසනාව' එළිදක්වමින් පළමු වරට රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම් හඳුන්වාදෙන ලදී. ආරම්භයේදී සෙනසුරාදා පමණක් දිනුම් අදින ලද ශනිදා වාසනාව පසුව බදාදා දින වලද දිනුම් ඇදීම් සිදුකරන ලදී.

සෑම ඉරිදාවකම දිනුම් ඇදීම් සිදුකරමින් 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීමේ දෙවන අදියර වසර 1998 ජනවාරි මස 25 වැනි දින ඇරඹිණි. මෙය දිනුම් නොමැති සුරන ලොතරැයි සඳහාම නිර්මාණය කෙරිණි. මේ සඳහා පුළුල් ජනතා ප්‍රතිචාරයක් හිමි විය. 'සංවර්ධන වාසනාව' නම් වූ දෙවන රූපවාහිනී දිනුම් ඇදීම 1998 ඔක්තෝබර් මස 9 වැනි දින හඳුන්වාදෙන ලදී. මෙම දිනුම් ඇදීම අඟහරුවාදා සහ සිකුරාදා දිනයන්හිදී සිදු කෙරිණි. මෙම ලොතරැයියේ සුවිශේෂීත්වය වූයේ ජයග්‍රහණ ලබාගැනීම සඳහා අංක සමග ලග්න සංකේතද භාවිත කිරීමයි.

2006 ජනවාරි මස 26 වැනි දින සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනුම් අදිනු ලබන 'ජයෝදා' ලොතරැයිය හඳුන්වාදීමට අප සමත් විය. මෙම ලොතරැයිය මගින් සාමාන්‍ය මහා තෑගි මුදල සහ සෙසු මුදල් ත්‍යාග වලට අමතරව සුපිරි මහා තෑගි මුදලක්ද පිරිනැමේ. මෙම සුපිරි මහා තෑගි මුදල ඇරඹෙනුයේ රුපියල් මිලියන 10 ක මූලික මුදලකිනි. සාමාන්‍ය මහා තෑගි මුදලෙහි ජයග්‍රාහකයින් හට රුපියල් මිලියනයේ මුදල් ත්‍යාගය හෝ රුපියල් මිලියනයක් වටිනා නිවසක් තෝරාගත හැකි අතර මෙය සිදුකෙරුණේ ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ ප්‍රථම වරටය.

2009 අප්‍රියෙල් මස 10 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනයන්හිදී දිනුම් අදිනු ලබන 'ජන ජය' ලොතරැයිය හඳුන්වාදෙන ලදී. මෙය ජයග්‍රහනය සඳහා අංක 64ක් අතුරින් අංක 4ක් ගැළපිය යුතු අතර වෙනත් යන්ත්‍රයකින් තෝරා ගනු ලබන අංක 12 ක් අතුරින් සුපිරි අංකයද ගැළපිය යුතු වේ. මෙහි සුපිරි මහා තෑගි මුදල රුපියල් මිලියන 2.5 ක මූලික මුදලකින් ආරම්භ වේ.

2012 ජූලි මස 10 වැනි දින 'සුපර් බෝල්' ලොතරැයිය හඳුන්වාදීම ලොතරැයි ඉතිහාසයේ කැපී පෙනෙන සන්ධිස්ථානයකි. එදා මෙදා තුර වැඩිම සුපිරි මහා තෑගි මුදල වන රුපියල් මිලියන 30 පිරිනමන මෙම ලොතරැයිය පොදු ජනතාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත්විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් උපයනු ලබන ආදායම සමස්ත ජාතිය වෙත සෞභාග්‍යය උදාකරවීමේ උදාර අරමුණ උදෙසා ජනාධිපති අරමුදල වෙත බැර කෙරේ. එම ආදායමෙන් 50% ක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත බැර කෙරෙන අතර එමගින් දේශයේ අධ්‍යාපනය වෙත සාධනීය දායකත්වයක් සපයනු ලැබේ. තවද, දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, සෞඛ්‍ය අවශ්‍යතා, ආගමික සිද්ධස්ථාන සහ සුබසාධන සංගම් නඩත්තු කිරීම, ක්‍රීඩා සහ කලා කටයුතු නගාසිටුවීම වැනි අරමුණු වෙත පිරිනැමීමට පියවර ගැනෙන අතර එමගින් සමස්ත ප්‍රජාව වෙත වඩාත් යහපත් හෙටදිනක් උදා කිරීම අපේක්ෂාව වේ.

# සන්ධිස්ථාන

## 1987

ප්‍රථම රූපවාහිනි ලොතරැයි දිනුම් ඇදීම වන **'ශනිදා වාසනාව'** හඳුන්වාදීම.

## 1993

**'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය'** බවට පරිවර්තනය වීම.

## 1997

**'සංවර්ධන ලොතරැයි භාරය'** 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත යටතේ **'සංවර්ධන ලොතරැයි මණ්ඩලය'** බවට පත් වීම.

- බිලියන දෙකක පිරිවැටුම් මට්ටමක් අත්පත් කරගැනීම

## 1998

**'වාසනා චක්‍රය'** රූපවාහිනි දිනුම් ඇදීම හඳුන්වාදීම. එය දිනුම් නොලද සුරන ලොතරැයි ටිකට් පත් වෙනුවෙන් නිර්මාණය කෙරිණි. **'වින්ඩෝස්'** ක්ෂණික ලොතරැයිය සහ ජයග්‍රාහී ත්‍යාගය වශයෙන් අති සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනැමෙන රුපියල් 100 ක් වටිනා **'යුරේකා'** ලොතරැයිය සමගින් **'සංවර්ධන වාසනාව'** ලොතරැයිය හඳුන්වාදීම.

## 1999

ලෝක බැංකුවේ සහාය සහිතව Y2K අර්බුදයන්ට මුහුණදීම සඳහා පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීම.

## 2004

පළමු වරට මුදල් ත්‍යාගය හෝ නිවසක් තෝරාගැනීමේ විශේෂාංගය සහිතව **'ජයෝදා'** ලොතරැයිය හඳුන්වාදීම.

- බිලියන තුනක පිරිවැටුම් මට්ටමක් අත්පත් කරගැණිනි.

## 2008

සංවර්ධන ලොතරැයියටම අයත් නිවහනක් කොළඹ 02 ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවතේ අංක 356 දරණ ස්ථානයේ විවෘත කිරීම්

- බිලියන පහක පිරිවැටුම් මට්ටමක් අත්පත් කරගැණිනි.

## 2010

සුපිරි මහා තෑගි මුදලක් සමගින් **'ජන ජය'** ලොතරැයිය හඳුන්වාදීම.

## 2011

**'නියත ජය'** ලොතරැයිය හඳුන්වාදීම.

## 2012

එදා මෙදා තුර පිරිනැමුනු විශාලතම තෑගි මුදල වන රුපියල් මිලියන 30 ක සුපිරි මහා තෑගි මුදලක් සමගින් **'සුපර් බෝල්'** ලොතරැයිය හඳුන්වාදීම.

## 2013

ඉහළම සුපිරි මහා තෑගි මුදලක් සමගින් **'හයිවේ ඩ්‍රීම්'** ලොතරැයිය හඳුන්වාදීම.

## 2014

SMS ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.

# මූල්‍යමය විශේෂතා

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර | |
|---|---|---|
| | **2015** | 2014 |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| ආදායම | **11,874,659,603** | 12,271,477,490 |
| දළ ලාභය | **5,137,214,449** | 5,409,516,014 |
| බදු පෙර ලාභය | **2,389,616,614** | 2,422,222,956 |
| බදු වියදම් | **56,356,927** | 68,976,618 |
| ශුද්ධ ලාභය | **2,333,259,687** | 2,353,246,338 |
| | | |
| **මූල්‍යමය ස්ථාවරත්ව ප්‍රකාශය** | | |
| **වත්කම්** | | |
| දේපළ පිරියත සහ උපකරණ | **730,360,335** | 709,275,189 |
| කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍යමය වත්කම් | **807,514,816** | 885,551,607 |
| තොග | **32,603,696** | 43,580,565 |
| වාණිජ ණයගැතියන් සහ වෙනත් ලැබිය යුතු මුදල් | **35,401,941** | 34,126,920 |
| පෙරදායකවීම් සහ තැන්පතු | **5,631,264** | 14,993,931 |
| අත ඇති සහ බැංකුවේ පවතින මුදල් | **338,946,957** | 249,562,916 |
| **මුළු වත්කම්** | **1,950,459,010** | 1,937,091,128 |
| | | |
| **වගකීම්** | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | **30,303,482** | 22,950,327 |
| අලෙවි නියෝජිතයන් සහ බෙදාහරින්නන් වෙත ගෙවිය යුතු තැන්පතු | **28,380,381** | 27,314,881 |
| ගෙවිය යුතු ණය වව්චර | **203,705,730** | 173,022,800 |
| වාණිජ සහ ගෙවිය යුතු වෙනත් මුදල් | **441,763,122** | 344,061,901 |
| ජනාධිපති අරමුදල වෙත ගෙවියු යුතු මුදල් | **99,010,739** | 250,598,866 |
| ගෙවිය යුතු ත්‍යාග මුදල් | **208,869,321** | 237,706,166 |
| | | |
| **ස්කන්ධ** | | |
| ජනාධිපති අරමුදල | **2,200,000** | 2,200,000 |
| මහපොළ භාර අරමුදල | **2,200,000** | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | **934,026,234** | 877,036,186 |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | **1,950,459,010** | 1,937,091,128 |
| | | |
| **ලාභදායීත්ව අනුපාතය** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | **20%** | 19% |
| දළ ලාභ අනුපාතය | **43%** | 44% |
| | | |
| **ද්‍රවශීලතා අනුපාතය** | | |
| ජංගම වත්කම් අනුපාතය | **0.63** | 0.58 |
| කඩිනම් (ද්‍රවශීල) වත්කම් අනුපාතය | **0.58** | 0.51 |

# කළමනාකරණ වාර්තා



# සභාපතිවරයාගේ පණිවුඩය

**"1983 දී සංස්ථාපනය කරන ලද තැන් පටන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වසර 32 ක විශිෂ්ට සේවා කාලයක් සම්පූර්ණ කරන ලදී."**

**"සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යවස්ථාමය අරමුණ වනුයේ ජනාධිපති අරමුදල සඳහා අරමුදල් සම්පාදනයයි."**

ආදායම් ඉපැයීම, රැකියා අවස්ථා උත්පාදනය, ආර්ථික අතිරික්ත සම්පාදනය, ප්‍රජා සහයෝගීතාවන් සහ සේවක ස්වේච්ඡා මෙහෙවර තුළින් අපගේ ප්‍රජාව වෙත කැපීපෙනෙන දායකත්වයක් දක්වන්නා වූ ආයතනයක් වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ, විගණිත මූල්‍යමය ප්‍රකාශයන්ද සමග 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඔබ හමුවේ තබන්නේ ඉමහත් සතුටිනි. උපරිම විනිවිදභාවයකින් යුතුව කටුයතු කිරීමේ වැදගත්කම සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ඉතා අගය කොට සලකන අතර එමනිසා අපගේ වැඩසටහන්, සංවර්ධන ක්‍රියාදාමයන්, ව්‍යාපෘතීන් සම්බන්ධ තොරතුරු හුවමාරු කරගැනීමේ අවස්ථාව උදා වූ විගස අප විසින් අදාළ තොරතුරු ඔබ සමග බෙදාහදා ගැනීමට කටයුතු කරමු.

2001 සිට 2014 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ආදායම් බදු නොගෙවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් තාවකාලිකව අපගේ බැංකු ගිණුම් අත්හිටුවන ලද අතර ඒ හේතුවෙන් වසර 2015 අලෙවියෙහි අඩුවීමක් වාර්තා විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් අදාළ ආයතනයන් සමග මෙම ගැටලුව විසඳීම සඳහා වැඩසටහනක් දියත් කරමින් නිසි පරිදි අර්බුදය නිරාකරණය කිරීමට කටයුතු යොදන ලදී. අලෙවිය පහළ යාම කෙරෙහි මෙම මූල්‍යමය කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකාව ජාතික මැතිවරණ දෙකකට මුහුණදීමද හේතුවිය. මෙකී බාධක හමුවේ වුවද විශිෂ්ට පිරිවැය කළමනාකරණ මූලධර්ම ක්‍රියාවට නංවමින් රුපියල් බිලියන 2.3 ක දැවැන්ත ශුද්ධ ලාභයක් වාර්තා කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත් විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි පෙර පැවති කළමනාකාරීත්වය විසින් අදායම් බදු ගෙවීමට පියවර නොගැනීම හේතුවෙන් නොගෙවන ලද බදු වගකීම් රුපියල් මිලියන 3,175 ක් දක්වා ඒකරාශීව පැවතිණි. වර්තමාන කළමනාකාරීත්වය මගින් දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමග එකඟත්වයට පත් කාලසීමාවක් තුළ මෙම බදු වගකීම ගෙවීමට විධිවිධාන යොදන ලදී. 2015 මූල්‍යමය වසර තුළදී මෙසේ රුපියල් මිලියන 554 ක සමස්ත මුදලක් පියවන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපති අරමුදල වෙත සිදුකෙරෙන දායකත්වය පහත වැටිණි.

2015 මූල්‍යමය වර්ෂය තුළ අප විසින් සුදුසුකම් ලත් අභ්‍යන්තර විගණන නිලධාරියකු සමගින් විගණන අංශයක් ස්ථාපනය කරන ලද අතර එයට අමතරව තොග පාලනය සඳහා නව ක්‍රියාපටිපාටීන්, ලේඛණ සහ තත්ත්ව සම්මතයන් ක්‍රියාවට නැංවීම සඳහා තොග පාලන අංශයක්ද පිහිටුවන ලදී.

නව අලෙවි නියෝජිතයින් සහ අලෙවි කුටි යොදාගනිමින් අප විසින් යාපනය දිස්ත්‍රික්කය තුළ නව ප්‍රවර්ධන ව්‍යාපෘතීන් දියත් කරන ලද අතර එහිදී නල්ලූර් උත්සවයට සහභාගීවීම කැපී පෙනෙන සිදුවීමකි. මනා කාර්යසාධනයක් සහිත අලෙවි බෙදාහරින්නන් සහ නියෝජිතයින් වෙත නොමිලේ ටිකට් පොත් ලබාදෙමින් දියත් කරන ලද ප්‍රතිලාභ සැලසුම් හේතුවෙන් අලෙවි පරිමාව වර්ධනය වූ අතර එහිදී අදාළ ලොතරැයි අලෙවි නියෝජිත ප්‍රජාව සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය අතර සුහදත්වය සහ අවබෝධය ඉහළ නැංවිණි. වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ආයතනික සමාජ වගකීම ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් රැසක් සිදුකරන ලද අතර එහිදී අලෙවි නියෝජිතයින්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව 92ක් පිරිනැමීමද, සෞඛ්‍ය සායන පවත්වමින් අලෙවි නියෝජිතයනි 61 දෙනෙකු වෙත වෛද්‍යාධාර ලබාදීමද සිදුකෙරිණි.

ඉතාලි තානාපතිවරයා වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික සේවා ධූරයක් පිළිගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් කටයුතු කළ දයා පැල්පොල මහතා 2015 ඔක්තෝබර් මස ඉල්ලා අස්විය. සිය ධූරයේ සිදුකරන ලද අති



ප්‍රශංසනීය කාර්යභාරය වෙනුවෙන් මණ්ඩලය වෙනුවෙන් දයා පැල්පොල මහතා වෙත මෙසේ මාගේ ප්‍රණාමය පුද කරමි.

තවද ලබාදුන් සහයෝගය සහ උපදෙස් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය, අධ්‍යක්ෂ මණ්ඩලය, උප සභාපතිනිය සහ සාමාන්‍යාධිකාරීවරයා වෙත මාගේ විශේෂ ස්තුතිය පළ කර සිටිමි. එමෙන්ම අපගේ විවිධ වූ පාර්ශවකරුවන් සමග කටයුතු කරමින්ද, එහිදී අපගේ ප්‍රජාවන් වෙත සහාය දක්වමින්ද, ගනුදෙනුකරුවන් වෙත විශිෂ්ට සේවාවක් ලබාදීම සඳහා නිරන්තරයෙන් කටයුතු කළ අතිශය දක්ෂ සහ කැපවූ අතීත සහ වර්තමාන කාර්ය මණ්ඩලයක සහාය ලබාගනිමින් සේවය කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටට පත්වෙමි.

තවද දිනුම් ඇදීම් අධීක්ෂණ මණ්ඩල සමාජිකයින්, ජනාධිපති අරමුදලෙහි කාර්ය මණ්ඩලය, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල, බෙදාහරින්නන්, අලෙවි නියෝජිතයින්, අලෙවි සහායකයින්, ජනමාධ්‍ය, බැංකු, විගණකවරුන් සහ සැපයුම්කරුවන් වෙතද මාගේ කෘතඥතාව පුද කරමි, ඔවුන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ අපගේ කාර්යභාරය වඩාත් අර්ථාන්විත බවට පත්කිරීම සඳහා සැබැවින්ම සහාය වූ බව මෙහිදී සිහිපත් කරමි.

**රොමේෂ් ජයවර්ධන**

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

සංවර්ධන ලොතරැයි මණ්ඩලය



# අධ්‍යක්ෂ මණ්ඩලය (2015)

**දයා පැල්පොල මයා**

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී (2015/10/20 දින ඉල්ලා අස්විය)

**රොමේෂ් ජයවර්ධන මයා**

වර්තමාන සභාපති (2015/10/29 දින සිට)

**ආර් අයි විමලසේන මිය**

උප සභාපති

**ආචාර්ය වික්‍රම වීරසූරිය මයා**

අධ්‍යක්ෂ

**ඩී එන් නානායක්කාර මයා**

අධ්‍යක්ෂ

**එම් එස් ඩී රණසිරි මයා**

අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලයේ විමර්ශනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2015 වාර්ෂික වාර්තාව සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ විමර්ශනය ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ජනාධිපති අරමුදල ඔස්සේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල වෙත මුදල් සම්පාදනය කිරීමයි. විමර්ශනයට ලක් කෙරෙන කාල පරිච්ඡේදය තුළ අපගේ අලෙවියෙන් විශාල ලාභයක් උපයන අතරතුර, ගෞරවනීය ගනුදෙනුකරුවන් වෙත විශාල ත්‍යාග මුදලක් පිරිනමමින් ජනාධිපති අරමුදල වෙතද රුපියල් මිලියන 1,692 ක දායකත්වයක් ලබාදීමට හැකිවීම තුළින් අපගේ ප්‍රගතිය මැනවින් විදහා දැක්වේ.

වසර 2015 තුළදී අපගේ විශිෂ්ට කාර්යභාරය ඔස්සේ අත්පත් කරගත් සාර්ථකත්වයන් පහත දැක්වේ.

- ගනුදෙනුකරුවන් සෑහීමකට පත්වන ආකාරයේ වෙළඳපළ වෙත නව ලොතරැයිපත් හඳුන්වාදීම
- නව ආකර්ශනීය තෑගි ක්‍රම හඳුන්වාදීම ඔස්සේ අලෙවි ප්‍රවර්ධනයන් සිදුකිරීම
- යහපත් මූල්‍යමය විනයක් පවත්වාගෙන යාමට හැකි වීම
- ලොතරැයි බෙදාහරින්නන් සඳහා රැස්වීම් පවත්වමින් ගැටලු නිරාකරණය කරගැනීමට හැකි වීම
- වසර තුළදී රජය වෙත බදු වශයෙන් කැපී පෙනෙන මුදල් ප්‍රමාණයක් ගෙවීම

ගනුදෙනුකරුවන් වෙත මුදල් ත්‍යාග පිරිනමමින්ද , විසි දහසකට ආසන්න අලෙවි සහායකයින් වෙත දීමනා ලබාදෙමින් ද, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරවීමෙහිලා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රශංසනීය දායකත්වයක් දක්වන ලද බව මෙහිදී සඳහන් කළ යුතු වේ. එමෙන්ම සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් සෞඛ්‍ය සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන් වෙතද කැපී පෙනෙන අයුරින් මූල්‍යමය සහාය දක්වන ලදී . අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මගින් තීරණ ගැනීම, ගිණුම්කරණ හා කළමනාකරණ කමිටු රැස්වීම් ඔස්සේ නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙනයාම වැනි සාධක මෙන්ම කාර්ය මණ්ඩලයේ අපරිමිත කැපවීම, විගණකවරුන්ගේ මග පෙන්වීම සහ හිතෛෂී ගනුදෙනුකරුවන් නිසාවෙන් මණ්ඩලයට ප්‍රශස්ත ඵලදායී මට්ටමක් කරා ළඟා වීමේ අවස්ථාව උදා විය. එළඹෙන වසරේදීද මෙම ජයග්‍රහණයන් තවදුරටත් ඔප් නංවා ගැනීමට අපි අපේක්ෂා කරමු.

**ඩී එන් නානායක්කාර**

අධ්‍යක්ෂ

# කළමනාකරණ කණ්ඩායම

**ජේ එම් සමන් ජයසිංහ මයා**

සාමාන්‍යාධිකාරී

**අනුර ජයරත්න මයා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි

**විජිතා සෝමරත්න මෙනෙවිය**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**චානක දොඩංගොඩගේ මයා**

සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**කපිල බුලත්සිංහල මයා**

සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**අසංකා එස් ගුණසිංහ මිය**

සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**සුනිල් ජයරත්න මයා**

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**කසුන් ජයසූරිය මයා**

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**නිෂාන් පෙරේරා මයා**

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**වසන්ත සේනාධීර මයා**

අභ්‍යන්තර විගණන නිලධාරී

**නුවන් අබේරත්න මයා**

පරිපාලන නිලධාරී

**මේජර් ජේ එම් ඩී ඒ ක්‍රිශාන්ත**

ප්‍රධාන ආරක්ෂක නිලධාරී

# මෙහෙයුම් විමර්ශනය

## කළමනාකරණ සමාලෝචනය සහ විමර්ශනය

කළමනාකරණ සමාලෝනය සහ විමර්ශනයෙහි ඉදිරිපත් කෙරෙන තොරතුරු වල විශ්වසනීයත්වය සහ කාලෝචිත බව කෙරෙහි කළමනාකාරීත්වය වගකීම දරන අතර, එහිදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් භාවිත කෙරෙන පද්ධති, පාලනයන් සහ ක්‍රියාපටිපාටීන්ගේ යෝග්‍ය වූ පැවැත්ම හා බලාත්මකභාවය ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය සිදු කෙරේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් සමාජයීය වශයෙන් වගකීම් සහගතව සිය ගනුදෙනුකරුවන් වෙත ජාත්‍යන්තර තත්ත්වයේ නිෂ්පාදන හා සේවාවන් ලබාදෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් අභිබවා යාම සඳහා කැපවීමෙන් කටයුතු කරයි.

නව්‍යතාව, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සපිරි සේවා වටපිටාවක් තුළ අඛණ්ඩව ඉදිරියට යාමට සංවර්ධනය ලොතරැයි මණ්ඩලය නිරන්තරයෙන් කටයුතු කරයි මෙකී ක්‍රමෝපායික දිශානතීන් සහ ප්‍රමුඛතාවන් වෙත කළමනාකරණ කමිටුවෙහි දායකත්වය සැපයෙන අතර, එමගින් ප්‍රගතිශීලී සැලසුම්කරණ ක්‍රියාවලීන්, මූල්‍ය කළමනාකරණය, ප්‍රතිපත්ති, තත්ත්ව සම්මතයන් සහ ක්‍රියාපටිපාටීන් සහ කාර්යසාධන මිනුම් සම්බන්ධයෙන් තහවුරු කෙරේ.

## 2015 දී ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරය

### වර්ධනය

2014 දී පැවති 4.9% ට සාපේක්ෂව වසර 2015 දී ශ්‍රී ලංකාවේ සැබෑ ආර්ථික වර්ධනය 4.8% ක් වශයෙන් වාර්තා විය. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අපනයන වෙළඳපල වල ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමී වීම අපනයන ක්ෂේත්‍රය කෙරෙහි අහිතකර අයුරින් බලපෑ අතර එක්සත් ජනපද ආර්ථික සවිමත් වීම හේතුවෙන් කෙටි කාලීන ප්‍රාග්ධන පිටත ගලායාමක් සිදුවිය. මෙම තත්ත්වයන්හි බලපෑම පහළ ජාත්‍යන්තර භාණ්ඩ මිල මගින් යම්තාක් දුරකට පියවන ලදී . විශේෂයෙන් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ ආදායම් වර්ධනය වීමත් සමග දේශීය පරිභෝජනය නැවත ඉහළ ගියේය. 2015දී කෘෂිකාර්මික හා සේවා ආශ්‍රිත ක්ෂේත්‍රයන් පිළිවෙලින් 5.5% ක සහ 5.3% ක වර්ධනයක් වාර්තා කල අතර කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් 3.0% කින් වර්ධනය විය.

### උද්ධමනය

ප්‍රධාන වශයෙන් පහළ ගිය භාණ්ඩ මිල හේතුවෙන් 2015 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (CCPI) වසරින් වසර අයකිරීම මත මනිනු ලබන උද්ධමනය සෘණාත්මක ක්ෂේත්‍රයේ පැවතිණි. 1995 මාර්තු මාසයෙන් පසු උද්ධමනය සෘණ අතට හැරුනු ප්‍රථම වතාව මෙය විය. කෙසේවුවද 2014 වසර අවසානයේදී වාර්තා වූ 2.1 ට සාපේක්ෂව 2015 අවසානයේදී වසරින් වසර උද්ධමනය 2.8 වශයෙන් වාර්තා විය. එයට සමගාමීව කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් බලශක්තිය සහ තෝරාගත් ආහාර ද්‍රව්‍ය ඉවත් කෙරෙන මූලික උද්ධමනය 2015 පෙබරවාරි මස වසරින් වසර පදනමක් මත 0.8% සිට වර්ධනය වූ අතර වසර අවසානය වන විට එය 4.5% ක් වශයෙන් වාර්තා විය, මෙයට ප්‍රධාන වශයෙන් බැංකු ණය වල ශීඝ්‍ර වර්ධනය සහ රජයේ සේවකයින් සහ ආර්ථිකයේ වෙනත් ක්ෂේත්‍රයන්හි සේවකයින් වෙත පිරිනමන ලද ඉහළ වේතන හේතු විය.

### ඍජු විදේශ ආයෝජන සහ දළ දේශීය නිෂ්පාදිතය

මේ අතර පහළගිය තෙල් මිල සහ සංචාරක ක්ෂේත්‍රයෙහි සුබවාදී ප්‍රවණතා හේතුවෙන් ලද කැපී පෙනෙන ආදායම හමුවේ වුවද විදේශ නියුක්තික විනිමය සහ ප්‍රාග්ධන පිටත ගලනයන් ඇතුළු ශුද්ධ විදේශ විනිමය ලැබීම් මන්දගාමී වීම හේතුවෙන් ගෙවුම් ශේෂයෙහි (BOP) සමස්ත හිඟයක් නිර්මාණය විය. රාජ්‍ය බදු සහ බදු නොවන ආදායම් වල මෙම ප්‍රතිගාමී ප්‍රවණතාව ආපසු හැරවීම සඳහා දරන ලද ප්‍රයත්නයන් සාමාන්‍ය වශයෙන් සාර්ථක වුවද රජයේ අයවැයෙහි වියදම් පාර්ශවය ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.4% ක් වෙතැයි අපේක්ෂා කළ අයවැය හිඟය 7.4% ක් වශයෙන් වාර්තා විය. 2015 අවසානය වන විට මධ්‍යම රජයේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිත 76.0% දක්වා වර්ධනය විය. 2015 ජනවාරි මස බිහි කළ සම්මුතිවාදී රජය 2015 අගෝස්තු මස පැවති මහා මැතිවරණයට පෙරාතුව දින 100 වැඩසටහනක් ක්‍රියාවට නැංවීම සඳහා අවධානය යොමු කළේය.

## මූලික ක්‍රියාකාරකම්

මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම වූයේ ලොතරැයි නිෂ්පාදන මෙහෙයුම සහ කළමනාකරණය ඔස්සේ විශ්ව විද්‍යාල සිසුන් වෙත මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා ජනාධිපති අරමුදල වෙත මුදල් සම්පාදනය කිරීම සහ දිවයිනේ සහාය අවැසි ජනතාවට සෞඛ්‍ය සහාය ලබාදීමයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ පාලනය වේ.

විමර්ශනයට ලක් කෙරෙන වසර තුළ සිය මූලික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා මණ්ඩලය පහත දැක්වෙන ලොතරැයි සම්බන්ධ මෙහෙයුම් සිදු කළේය.

| අපගේ ලොතරැයි නිෂ්පාදන පෙළ |
|---|
| ශනිදා වාසනාව |
| ලග්න වාසනා |
| ජයෝදා |
| ගැලැක්සි ස්ටාර් |
| නියත ජය |
| සුපර් බෝල් |
| ක්ෂණික |

## 2015 දී කාර්යසාධන දර්ශකයන්හි විශේෂතා

| | 2015 | 2014 |
|---|---|---|
| ඉහළම මහා තෑගි මුදල | 56,974,540 | 100,000,000 |
| මසකට බිහිකෙරෙන ජයග්‍රාහකයින්ගේ සාමාන්‍යය | 12,237,438 | 12,317,547 |
| මුළු අලෙවිය (වාර්ෂික) | 11,874,659,603 | 12,271,477,490 |
| ගෙවන ලද මුළු තෑගි මුදල | 6,150,951,795 | 6,211,302,790 |
| ජයග්‍රාහකයින් සංඛ්‍යාව | 146,849,258 | 147,810,558 |
| බිහිකරන ලද මිලියනපතියන් සංඛ්‍යාව | 575 | 583 |
| ජනාධිපති අරමුදල වෙත දායකත්වය | 1,628,053,000 | 1,834,814,000 |

## අලෙවි සහ මෙහෙයුම් විශේෂතා

වසර 2015 තුළදී භාවිත කරන ලද සම්බන්ධීකරණය කරන ලද අලෙවි ක්‍රියාකාරකම් සාර්ථකත්වය අත්පත් කරගත්තේය. විචක්ෂණ ප්‍රවර්ධන චිළඹුම් ඉහළ ලාභදායීත්වය සහ කාර්යක්ෂමතාවන් සමගින් ජනාධිපති අරමුදල වෙත සැලකිය යුතු මුල්‍යමය දායකත්වයක් දක්වන අතරම ජයග්‍රාහකයින් වෙත වැඩි දිනුම් අවස්ථා සමගින් වැඩි තෑගි මුදලක් පිරිනැමීමට ද මණ්ඩලය සමත් විය.

පහත දැක්වෙන අවස්ථාවන් අලෙවි ක්‍රියාකාරකම් වල වර්ධනයන් වශයෙන් හැඳින්විය හැක ඃ

## ප්‍රති ලාංඡනගත කිරීම් සහ විශේෂ ප්‍රවර්ධන එළිදැක්වීම්

### ජන ජය ලොතරැයිය ගැලැක්සි ස්ටාර් යනුවෙන් ප්‍රතිලාංඡනගත කිරීම

නව මුහුණුවරක් ලබාදීමේ අරමුණින් යුතුව ජනජය ලොතරැයිය ප්‍රති ලාංඡනගත කරන ලද අතර එහිදී නව තෑගි ක්‍රමයක් සමගින් ආකර්ශනීය ටිකට් පතක් ඉදිරිපත් කෙරිණි. නාමය ගැලැක්සි ස්ටාර් යනුවෙන් වෙනස් කරන ලද අතර එමගින් වැඩි ගනුදෙනුකරුවන් ඔස්සේ ඉහළ අලෙවි වර්ධනයක් අත්පත් කරගැනිණි.

### නත්තල් උත්සව සමය සඳහා විශාල ප්‍රමාණයේ ලොතරැයි පතක් හඳුන්වාදීම

නත්තල් උත්සව සමය වෙනුවෙන් 'ලග්නෙට කලින්ම නත්තල්' යනුවෙන් විශාල ප්‍රමාණයේ ටිකට් පතක් හඳුන්වාදෙන ලද අතර ඒ සඳහා අමතර තෑගි පිරිනැමිණි. එමගින් 2015 දෙසැම්බර් 01 වැනි දින රුපියල් මිලියන 2.33 ක අලෙවියක් වාර්තා කෙරිණි.

### නත්තල් උත්සව සමය සඳහා සුපර් බෝල් සුපර් බෝනස් විශේෂ හඳුන්වාදීම

නත්තල් උත්සව සමය සඳහා සුපර් බෝල් ලොතරැයියට අමතරව විශාල ප්‍රමාණයේ සුපර් බෝනස් ලොතරැයිය හඳුන්වාදෙන ලද අතර එමගින් 2015 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 2.8 ක අලෙවි වර්ධනයක් වාර්තා කෙරිණි.

### ලොතරැයි ටිකට්පත්වල පෙනුම ආකර්ෂණීය අයුරින් වෙනස් කිරීම

මෙම වසරේ තෙවන කාර්තුවේදී සෑම නිෂ්පාදනයක් සඳහාම ලොතරැයි ටිකට්පත් වල තෑගි රටා වෙනස් කිරීමට මණ්ඩලය තීරණය කළේය. එහි විශේෂිත අරමුණ වූයේ ගනුදෙනුකරුවන්ගේ හිතෛෂීත්වය වර්ධනය කරමින් ලොතරැයි පත් වෙත වෙනස් වූ නව පෙනුමක් ලබාදීමයි.

### සංවර්ධන වාසනාව ලග්න වාසනාව නමින් ප්‍රති නාමකරණය

ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම සපුරාලනු වස් සංවර්ධන වාසනාව ටිකට්පත 2015 ජූලි මස 3 වැනි දින ලග්න වාසනාව නමින් වෙළඳපලට හඳුන්වාදෙන ලද අතර එහි අරමුණ වූයේ වැඩි ටිකට්පත් සංඛ්‍යාවක් අලෙවි කිරීමයි. වෙනස සාර්ථක විය.

### සුපර් බෝල් ටිකට් පතෙහි මහා තෑගි මුදල රුපියල් මිලියන 40 දක්වා වර්ධනය කෙරිණි

2015 ඔක්තෝබර් මස 29 වැනි දින සිට සුපර් බෝල් ටිකට් පතෙහි මහා තෑගි මුදල් රුපියල් මිලියන 30 සිට රුපියල් මිලියන 40 දක්වා ඉහළ නැංවීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුකරුවන්ගේ ආකර්ෂණය දිනාගැනීමට හැකි විය.

### දිනුම් නොලද ටිකට්පත් සඳහා තෑගි පිරිනැමීම

2015 ඔක්තෝබර් මස 30 වැනි දින සිට මසක කාලයක් පුරා ලග්න වාසනාව ලොතරැයිය මගින් දිනුම් නොලද ටිකට්පත් සඳහා තේ කෝප්ප කට්ටල තෑගි වශයෙන් පිරිනැමිණි. මෙම තෑගි රටාව ගනුදෙනුකරුවන් අතර ජනප්‍රියත්වයට පත් විය.

# මූල්‍යමය විමර්ශනය

## මූල්‍යමය කාර්සාධනය ආශ්‍රිත විමර්ශන ප්‍රතිඵල

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහයෝගීතාවයන් මත ගොඩනැගුනු ආයතනයක් වන අතර එමගින් අරමුණු ඉටුකරගැනීම සිහින සැබෑ කරගැනීම සහ සමස්තයත් වශයෙන් ජීවිත වලට යහපත් බලපෑමක් ඇති කිරීම අරමුණ විය. අපගේ ප්‍රජාව සැපයුම්කරුවන් සහ සේවකයින් සමග වඩාත් සවිමත් සබඳතා නිර්මාණය කරගැනීම සඳහා නව මං සොය යන අතර අපි වැඩි වැඩියෙන් සවිමත් වීමු.

2015 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍යමය ප්‍රකාශයන්ට අනුව විමර්ශනයට ලක් වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් වල ප්‍රතිඵලයක් වශයෙන් 2014 දී පූර්ව ආදායම් බදු වශයෙන් ගෙවන ලද රුපියල් 284,896,813 ට සාපේක්ෂව 2015 දී පූර්ව ආදායම් බදු වශයෙන් රුපියල් 606,195,948 ක කැපී පෙනෙන මුදල් සම්භාරයක් ගෙවීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 දී ජනාධිපති අරමුදල වෙත දායකත්වය රු 1,628,053,000 දක්වා දක්වා 11% කින් පහත වැටුනු අතර එයට හේතු වූයේ 2001 සිට 2009 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සිදුවී ඇති බදු සම්බන්ධ ගැටලු නිරාකරණය කරගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග එළඹි එකඟතාවයයි.

විමර්ශනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩල මගින් පෙර වසරේ වාර්තා කරන ලද රු 2,353,246,338 ක ලාභයට සාපේක්ෂව රු 2,333,259,687 ක ලාභයක් වාර්තා කෙරිණි.

## 2015 දී එක් එක් නිෂ්පාදනය ආශ්‍රිත ගෙවන ලද මුළු තෑගි මුදල් සහ බිහිකරන ලද ජයග්‍රාහකයින් සංඛ්‍යාව

| ලොතරැයි නිෂ්පාදන | ගෙවන ලද තෑගි මුදල් රු. | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|
| ශනිදා වාසනාව | 1,270,434,000 | 27,181,310 |
| ලග්න වාසනා | 1,491,265,928 | 40,350,419 |
| ජයෝදා | 712,092,000 | 18,433,106 |
| ගැලැක්සි ස්ටාර් | 551,431,323 | 15,028,507 |
| නියත ජය | 588,235,500 | 15,228,196 |
| සුපර් බෝල් | 1,261,931,500 | 30,627,030 |

## බෙදාහරින්නන් අලෙවි නියෝජිතවරුන් සහ අලෙවි සහයකයින් සඳහා ප්‍රතිලාභ සැලසුම්

අලෙවිය වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් සිය අලෙවි ඉලක්ක සපුරාලන ලද නියෝජිතවරුන් වෙත නොමිලේ ටිකට් පොතක් ලබාදෙන ලදී. මෙය අලෙවි ප්‍රජාව අතර ඉමහත් ජනප්‍රියත්වයට පත් වූ අතර එමගින් මණ්ඩලය සහ අලෙවි නියෝජිත දෙපාර්ශවයටම ප්‍රතිලාභ සැලසුනේ ඉහළ අලෙවියක් වාර්තා කරමිනි.

## උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව -

විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන ලියාපදිංචි අලෙවි නියෝජිතයින්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාවට නැංවිණි. වසර 2015 සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ශිෂ්‍යත්ව 92 ක් ප්‍රදානය කරන ලදී එහිදී වැය කරන ලද මුදල රු 828,000 කි.

## වෛද්‍ය පහසුකම්

වසර 2015 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 61 දෙනෙකු වෙත රු 12,94,069 ක වෛද්‍ය පහසුකම් සපයන ලදී .

## බෙදාහරින්නන් /නියෝජිත රැස්වීම්

2015 දී පහත දැක්වෙන දිස්ත්‍රික්කයන්හි පහත සඳහන් නියෝජිත රැස්වීම් පැවැත්විණි.

| දිනය | දිස්ත්‍රිතක්කය | ස්ථානය |
|---|---|---|
| 2015.09.10 | යාපනය | යාපනය |
| 2015.09.19 | අම්පාර/ මඩකළපුව | අම්පාර |
| 2015.09.20 | බදුල්ල /මොනරාගල / නුවරඑළිය | බණ්ඩාරවෙල |
| 2015.09.27 | රත්නපුර | රත්නපුර |
| 2015.12.13 | හම්බන්තොට/මොනරාගල | තිස්සමහාරාම |

## 2015 සඳහා නව බෙදාහරින්නන් පත් කිරීම්

| දිස්ත්‍රික්කය | බෙදාහරින්නන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 03 |
| ගාල්ල | 02 |
| කුරුණෑගල | 01 |
| අනුරාධපුර | 01 |
| මොණරාගල | 01 |
| රත්නපුර | 01 |
| ගම්පහ | 02 |
| කිලිනොච්චිය | 01 |
| **එකතුව** | 12 |

## 2015 සඳහා නව අලෙවි නියෝජිත පත් කිරීම්

| දිස්ත්‍රික්කය | අලෙවි නියෝජිත සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 10 |
| කළුතර | 03 |
| මහනුවර | 05 |
| මාතලේ | 04 |
| මඩකළපුව | 02 |
| අම්පාර | 02 |
| ත්‍රිකුණාමළය | 01 |
| කුරුණෑගල | 08 |
| නුවර එළිය | 01 |
| ගාල්ල | 07 |
| මාතර | 02 |
| යාපනය | 02 |
| මන්නාරම | 02 |
| රත්නපුර | 03 |
| ගම්පහ | 09 |
| පුත්තලම | 03 |
| අනුරාධපුර | 03 |
| පොළොන්නරුව | 02 |
| බදුල්ල | 04 |
| මොණරාගල | 03 |
| කෑගල්ල | 02 |
| මුලතිව් | 01 |
| එකතුව | 79 |

# තිරසාරත්ව වාර්තාව



# තිරසාරත්ව වාර්තාව

## අපගේ අරමුණ සහ වටිනාකම්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩවම අප විසින් තෝරා ගනු ලැබූ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ අති විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීමක් සහභාගීත්වයක් සහ විශ්වාසයක් නිර්මාණය කිරීම සඳහා වන පැහැදිලි අපේක්ෂාවකින් යුතුව කටයුතු කරයි. මෙම අපේක්ෂාව සපුරා ගැනීම සරල කාර්යයක් නොවන අතර එය තිරසාර අන්දමින් ව්‍යාපාරික කටයුතු සිදුකිරීමෙහි සමග වගකීම් සහගත ආයතනයක් බවට පත්වීම සඳහා අප සතු ශක්තිය මත බෙහෙවින් රඳා පවතී.

එහිදී අපගේ කැපවීමෙන් යුතු ධෛර්ය සම්පන්න වූ කාර්ය මණ්ඩලය ඉටු කරන ලද මෙහෙවර අසමසම වේ. අප හට සැබැවින්ම අභිමානයට පත් විය හැකි අන්දමේ සේවා වටපිටාවක් නිර්මාණය කරගැනීම සඳහා අප නිරන්තරයෙන් වෙහෙසෙනුයේ ඒ නිසාමය. අපගේ ව්‍යාපාරික සාර්ථකත්වය ඔවුන්ගේ සේවා තෘප්තිමත් බව මත උදක්ම රඳාපවතින අතර අප දන්නා නිසාම අඛණ්ඩව අපගේ කාර්ය මණ්ඩලය වෙත පුහුණු හා අධ්‍යාපන අවස්ථා ලබාදෙමින් සේවක විශිෂ්ටත්වය දිරිගන්වනු ලැබේ.

ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය කාර්යක්ෂම, සුරක්ෂිත හා සදාචාර සම්පන්න අන්දමින් ඉදිරියට ඇදීම තුළින් මෙහෙයුම් විශිෂ්ටත්වය කෙරෙහි වන අපගේ කැපවීම මැනවින් විදහා දැක්වේ. අප විසින් අපගේ ව්‍යාපාර කටයුතු වල බලපෑම පිළිබඳව ප්‍රවේසමෙන් සලකා බැලේ. මෙය හුදු වගකීමක් පමණක් කොට නොසලකමින් අපි අපගේ ගනුදෙනුකරුවන්ගේද, සේවයකයින්ගේද, සැපයුම්කරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේද, එමෙන්ම අපගේ ප්‍රජාවගේද, පරිසරයෙහිද, සමස්තයක් වශයෙන් සමාජයේද තත්ත්වය උසස් කරවීමෙහිලා අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව කටයුතු කරමු.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ සවිමත් ගනුදෙනුකාර සබඳතා ගොඩනගා ගැනීමේදී අපගේ සේවකයින් විසින් ඉටු කරනු ලබන කාර්යභාරයෙහි වැදගත්කම අප විසින් හඳුනාගෙන ඇත. අප හදවතින්ම අපගේ සේවකයින් අගය කරන අතර ඔවුන්ගේ අනගි මෙහෙවර පැසසුමට ලක්කරනු වස් අප විසින් නවතාවයෙන්, සහයෝගීතාවයෙන් සහ සහභාගීත්වයෙන් යුතු කාර්ය වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා නිරන්තරයෙන් ප්‍රයත්න දරනු ලැබේ.

කාර්ය මණ්ඩල සංවර්ධන අරමුණු ඃ

- වෘත්තීය සහ රැකියා අවස්ථාවන් නිර්මාණය සහ ප්‍රවර්ධනය.
- අඛණ්ඩවම ශ්‍රම බලකා සැලසුම් සහ කුසලතා කළමනාකරණ වැඩසටහන් උසස් තත්ත්වයේ බඳවාගැනීමේ සහ රඳවා ගැනීමේ ව්‍යාපෘතීන් නායකත්ව සංවර්ධනය සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් දියත් කිරීම.
- සිය සාර්ථකත්වයන් වෙනුවෙන් අපගේ සේවකයින් සවිබල ගැන්වෙන බවට හා ඒවා සැමරෙන බවට තහවුරු කිරීම.
- අපගේ සේවකයන් නිරන්තර දැනුවත්භාවකින් පසුවන බවට තහවුරු කිරීම.

## වසර තුළ පවත්වන ලද පුහුණු සහ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

| 2015 - පුහුණු වැඩසටහන් | | | | | |
|---|---|---|---|---|---|
| නො | ආයතනයේ නම | පාඨමාලාවේ නම | සේවක සංඛ්‍යාව | අංශය | පාඨමාලාවල කාලසීමාව |
| 1 | ද නොලේජ් පුද්ගලික සමාගම | මහජන ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ දේශනය | 4 | මූල්‍ය | 01 දින |
| 2 | ස්කිල්ස් ඩිවෙලොප්මන්ට් ෆන්ඩ් සමාගම | රියදුරන් සහ සහායකයින්ගේ රාජකාරි සහ වගකීම් | 17 | පරිපාලන | 02 දින |
| 3 | CADD සෙන්ටර් ලංකා පුද්ගලික සමාගම | කාර්යාලයීය දැනුවත් කිරීමේ වැඩසටහන් | 65 | 03 අංශය | 02 දින |
| 4 | ස්කිල්ස් ඩිවෙලොප්මන්ට් ෆන්ඩ් සමාගම | රියැදුරුගේ කාර්යභාරය සහ වගකීම් | 17 | පරිපාලන | 02 දින |
| 5 | ස්කිල්ස් ඩිවෙලොප්මන්ට් ෆන්ඩ් සමාගම | ආරක්ෂක නිලධාරීන්ගේ කාර්යභාරය සහ වගකීම් | 16 | පරිපාලන | 02 දින |
| 6 | ප්‍රැග් සර්විසස් (පුද්ගලික) සමාගම | විස්තරාමක මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටිය | 3 | මූල්‍ය | 03 දින |

| 2015 - පුහුණු වැඩසටහන් | | | | | |
|---|---|---|---|---|---|
| නො | ආයතනයේ නම | පාඨමාලාවේ නම | සේවක සංඛ්‍යාව | අංශය | පාඨමාලාවල කාලසීමාව |
| 7 | ස්කිල්ස් ඩිවෙලොප්මන්ට් ෆන්ඩ් සමාගම | ප්‍රවාහන කළමනාකරණය | 2 | පරිපාලන | 01 දින |
| 8 | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) | එළදායී ඊ මේල් රචනය සහ ලිඛිත සන්නිවේදන තාක්ෂණයන් පිළිබඳ වැඩමුළුව | 4 | 03 අංශය | 02 දින |
| 9 | | ගිනි නිවීමේ පුහුණුව | KKS / කාර්යාල කම්කරු | 03 අංශය | 01 දින |
| 10 | පැග් සර්විසස් (පුද්ගලික) සමාගම | වියදම් සහ ගෙවීම් ක්‍රියාපටිපාටිය | 9 | මූල්‍ය | 01 දින |
| 11 | සේවක අර්ථසාධක අරමුදල | අන්තර්ජාල බැංකුකරණය ඔස්සේ සේඅඅ වෙත දායකත්වය | 2 | මූල්‍ය | 01 දින |
| 12 | ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය | රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම සහ නිවේදනය | 1 | පරිපාලන | 16 දින |
| 13 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය | උලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - III | 1 | අලෙවි | මාස 6 |
| 14 | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) | මානව සම්පත් කළමනාකරණ උසස් සහතිකත්ව පාඨමාලා ආරම්භය | 3 | පරිපාලන | මාස 4 |
| 15 | CADD සෙන්ටර් ලංකා පුද්ගලික සමාගම | කාර්යාලයීය දැනුවත්භාවය පිළිබඳ පුහුණු වැඩසටහන | 6 | මූල්‍ය | 01 දින |
| 16 | ජාතික කම්කරු අධ්‍යයන ආයතනය | පිළිගැනීමේ නිලධාරී සහ දුරකථන ක්‍රියාකරුවන් සඳහා නිපුණතා සංවර්ධන පුහුණුව | 2 | පරිපාලන | 01 දින |
| 17 | ඇඩම්ස් ස්කිල්ස් ඩිවෙලොප්මන්ට් සෙන්ටර් | මයික්‍රොසොෆ්ට් එක්සෙල් - උසස් විමර්ශන මෙවලම් | 6 | මූල්‍ය | 01 දින |
| 18 | පැග් ආයතනය | රාජ්‍ය අංශ කළමනාකරණයෙහි මූලධර්ම | 1 | පරිපාලන | 01 දින |
| 19 | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | මයික්‍රොසොෆ්ට් ඔෆිස් සම්බන්ධ පුහුණුව | 9 | 03 අංශය | මාස 4 |
| 20 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 'ඩොක්ටර් ඇන්ඩ් ඇක්ටර්' - නව්‍ය අන්තර්ක්‍රියාකාරී අත්දැකීමක් | 3 | ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය | 01 දින |

සිය ලොතරැයි පෙළ ඔස්සේ ශ්‍රී ලාංකිකයින්ගේ දිවිපෙවෙත කෙරෙහි අඛණ්ඩ වූද තිරසාර වූද වටිනාකමක් එක් කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැපවී ක්‍රියාකරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් රඳා පැවතිය හැකි ව්‍යාපාර කටයුතු , ගනුදෙනකාර සහ ලොතරැයි ජයග්‍රාහකයින් සුරැකීමේ ව්‍යාපෘති මෙන්ම විවිධ ප්‍රජා සත්කාරක වැඩසටහන් ආශ්‍රයෙන් නිර්මාණය වේ. එමගින් සිය ආයතනික ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ නිසි අවධානය යොමු කෙරෙන අතර පාරිසරික වගකීම ඉටු කිරීමෙහිලා බලශක්ති සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කෙරේ.

## 2015 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ධූරාවලිය

| නිලය | විශේෂතාවය | අනුමත පිරිස | | | සේවයේ නියුතු පිරිස | | |
|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | නියෝජනය |
| සභාපති | | 1 | | | 1 | | |
| උප සභාපති | | 1 | | | 1 | | |
| සාමාන්‍යාධිකාරී | | 1 | | | | | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | | 2 | | | 2 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී | කළමනාකරුවන් | 9 | | | 6 | | |
| අභ්‍යන්තර විගණන නිලධාරී | | 1 | | | | 1 | |
| පරිපාලන නිලධාරී | පරිපාලකයින් | 1 | | | 1 | | |
| ප්‍රවාහන සහ නඩත්තු කළමනාකරු | | 1 | | | | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | | 1 | | | 1 | | |
| අලෙවි නිලධාරී | | 3 | | | | | |
| මූල්‍ය නිලධාරී | | 1 | | | | | |
| පරිගණක පද්ධති විමර්ශක | | 1 | | | | | |
| මිලදී ගැනීමේ නිලධාරී | | 1 | | | | | |
| මානව සම්පත් නිලධාරී | | 1 | | | | | |
| අලෙවි ප්‍රවර්ධන සහායක | | 14 | | | 14 | 2 | |
| මහජන සම්බන්ධතා නිලධාරී | | 1 | | | | | |
| තොරතුරු තාක්ෂණ සහායක | | 2 | | | | | |
| මූල්‍ය සහායක | | 2 | | | | | |
| ප්‍රධාන කළමනාකරන සහායක | | 1 | | | 1 | | |
| පෞද්ගලික සහායක | | 1 | | | 1 | | |
| කළමනාකරන සහායක | | 88 | | | 86 | 10 | |
| කළමනාකරන සහායක | දෙමළ | 2 | | | 3 | | |
| අලෙවි සම්බන්ධීකරණ නිලධාරී (කොන්ත්‍රාත්) | | 11 | | | 2 | 7 | |
| රියැදුරන් | DS | 34 | | | 32 | 1 | 1 |
| OES / කාර්යාල කම්කරු | | 36 | | | 46 | 2 | |
| විදුලි කාර්මික | | 1 | | | | | |
| ආරක්ෂක නිලධාරී/සහායක | | 3 | | | 16 | | |
| එකතුව | | 221 | 0 | 0 | 213 | 23 | 2 |

| වයස් කාණ්ඩය (අවුරුදු) | සේවක සංඛ්‍යාව පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| < 25 | 2 | 7 | 9 |
| 25 - 35 | 55 | 30 | 85 |
| 36 - 45 | 55 | 28 | 83 |
| 46 - 55 | 45 | 13 | 58 |
| > 55 | 2 | 1 | 3 |

| මූලික බඳවාගැනීමේ සුදුසුකම | සේවක සංඛ්‍යාව |
|---|---|
| ඉංජිනේරු පළමු උපාධිය හෝ වරලත් ඉංජිනේරු සුදුසුකම් | - |
| එල්එල්බී උපාධිය හෝ නීතිඥ | - |
| මූල්‍ය/ගිණුම්කරණ/වාණිජ පළමු උපාධිය හෝ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම/(CIMA) / ශ්‍රී ලංකා සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය (ICASL) | 25 |
| අදාළ ක්ෂේත්‍රයෙහි NVQ 5 මට්ටම හෝ NVQ 6 මට්ටම සහතිකත්වය | - |
| අදාළ ක්ෂේත්‍රයෙහි NVQ 4 මට්ටම සහතිකත්වය | - |

## විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල වෙත දායක විය යුතුය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය 15%ක දායකත්වයක් දක්වන අතර සේවකයා විසින් 10% ක දායකත්වයක් දැක්විය යුතු වේ. මණ්ඩලය මගින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 3% දායකත්වයක් දැක්වේ. පාරිතෝෂික සඳහා වෙන්කිරීම 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුකූලව සිදුකෙරේ.

## ආයතනික සමාජ වගකීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අපි ප්‍රජාව තුළ වටිනා සාමාජිකයකු වශයෙන් පිළිගැනීමට ලක් වීමට කැමැත්තෙමු. අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්තිය මත පදනම්ව අප විසින් අර්ථපූර්ණ දිගු කාලීන සබඳතා පවත්වා ගනිමින්, පාරිසරික වශයෙන් තිරසාර අයුරින් ව්‍යාපාරික කටයුතු සිදුකරමින්, සමාජමය වශයෙන් වගකීම් සහගත නිෂ්පාදන ඉදිරිපත් කිරීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් සිදු කරනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකා රජය ප්‍රජාව සහ දේශීය සමාජ සේවා ආයතන වෙත වැඩි වැඩියෙන් අරමුදල් සම්පාදනය කරමින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත සෞභාග්‍යමත් කිරීමට කටයුතු කරයි.

ලොතරැයි වෙළඳුන්ගේ සමස්ත දාමයක් වෙත සහාය දක්වමින් ව්‍යාපාරය ආශ්‍රිතව පුද්ගල ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම උදෙසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් සමාජ සුබසාධන ව්‍යාපෘතීන් කිහිපයක් දියත් කරන ලදී.

2015 දී අලෙවි නියෝජිතයන් වෙත බයිසිකල් සහ ට්‍රයිසිකල් ලබාදෙමින් සිදුකරන ලද ප්‍රජා සත්කාරය පහත වගුව මගින් දැක්වේ

| දිස්ත්‍රික්කය | ට්‍රයිසිකල් | බයිසිකල් |
|---|---|---|
| කොළඹ | 02 | 02 |
| බදුල්ල | 02 | - |
| අම්පාර | 03 | - |
| ගාල්ල | 01 | 01 |

## වෙනත් සුවිශේෂී ප්‍රජා සත්කාරයන්

අලෙවි නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාල දරුවන් වෙත ශිෂ්‍යත්ව ක්‍රමයක් අරඹන ලදී. 2015 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ශිෂ්‍යත්ව 92 ක් පිරිනමන ලද අතර ඒ සඳහා වැය වූ මුදල රුපියල් 828,000 කි.

සිය තනි පුද්ගල අලෙවි ඉලක්ක සපුරන ලද අලෙවි නියෝජිතයින් වෙත නොමිලේ ටිකට් පොත් පිරිනැමිණි. මෙය අලෙවි ප්‍රජාව අතර ඉමහත් ජනප්‍රියත්වයට පත් වූ අතර එහිදී දෙපාර්ශවයටම ප්‍රතිලාභ අත්විය.

2015 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් අලෙවි සහායකයින් සහ නියෝජිතයින් හැට එක් දෙනෙකු වෙත වෛද්‍ය පහසුකම් සඳහා රු 1,294,069 ක් පිරිනැමිණි.

# සාමූහික පාලනය

සාමූහික පාලනය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දීර්ඝ කාලීන ඉලක්ක සහ ක්‍රමෝපායික සැලසුම් කෙරෙහි මග පෙන්වන අතර, අප හට තීරණ ගැනීමේදී උපකාරී වන ක්‍රියාකාරකම් සහ මාර්ගෝපදේශන මූලධර්ම සකසනු ලැබේ. අපගේ සාමූහික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විවිධ මට්ටම්වල විශේෂයෙන්ම රජයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විධායක කළමනාකාරිත්ව මට්ටම් වල අධිකාරීත්වය සහ වගවීම තහවුරු කෙරේ. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනය සඳහා ආයතනික ප්‍රතිපත්ති සකසමින්, ව්‍යාපාරික මෙහෙයුම් සඳහා වගකිව යුතු ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීවරුන් වෙත ක්‍රමෝපායික දිශානතියක් සපයනු ලැබේ.

ආයතනික කාර්යභාරයන් සහ වගකීම් නිර්වචනය කෙරෙන ආයතනික පාලන ප්‍රතිපත්ති සහ යෙදුම් පහත දැක්වේ:

- සාමූහික පාලනය
- අධ්‍යක්ෂ මණ්ඩල/විධායක කළමනාකරණ සබඳතාව
- ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම
- ආයතනික ක්‍රමෝපාය සැලසුම්කරණය
- ආයතනික කාර්යසාධන කළමනාකරණය
- අභ්‍යන්තර විගණන
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ වියදම්
- අවදානම් කළමනාකරණය
- ආයතනික සමාජ වගකීම
- ව්‍යාපාරික සැලසුම සහ පිරිවැය සැලසුම් අනුමැතිය

## අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානත්වය උසුලන අතර හෙතෙම ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ආයතනයෙහිද ප්‍රධානත්වය දරයි සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙහෙයවීමේ වගකීම දරන ඉහළම ව්‍යුහය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයයි.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි සභාපතිවරයාගෙන් සහ පත්කරන ලද අධ්‍යක්ෂවරුන් 4 දෙනෙකුගෙන් සමන්විත වේ.

1. එක් අධ්‍යක්ෂකවරයකු ජනාධිපති අරමුදල නියෝජනය කරයි
2. එක් අධ්‍යක්ෂකවරයකු මහපොළ භාර අරමුදල නියෝජනය කරයි
3. එක් අධ්‍යක්ෂකවරයකු මුදල් අමාත්‍යාංශය නියෝජනය කරයි
4. විෂය භාර ඇමතිවරයා විසින් පත්කෙරෙන සාමාජිකයින් දෙදෙනෙක් (එක් අයකු සභාපතිවරයා විය යුතු වේ)

## සභාපති/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ වගකීම

- සභාපතිවරයා විසින් ආයතනික පාලනය ක්‍රියාවේ යෙදෙවෙන බවට තහවුරු කළ යුතු වේ.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල ප්‍රධානත්වය දරමින් නිසි ක්‍රියාපටිපාටීන් අනුගමනය කෙරෙන බවට තහවුරු කළ යුතු වේ.
- සියලුම අධ්‍යක්ෂකවරුන් හට සාමානාත්මතාවයෙන් යුතුව සලකන අතර ඔවුන්ගේ විශේෂඥ ක්ෂේත්‍රයන් සහ දැනුම් සම්භාරයන් තුළින් උපරිම දායකත්වයක් ලබාදෙමින් ඵලදායී කාර්යභාරයක් ඉටුකිරීම සඳහා ඔවුන් දිරිගැන්විය යුතු වේ.
- සභාපතිවරයා ප්‍රධාන විධායක නිලධාරීවරයා නොවන්නේ නම් ඔහු විසින් අධීක්ෂණ කාර්යභාරය ඉටුකළ යුතු වන අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට සහභාගී වීමෙන් වැළකී සිටිය යුතුය.
- ආයතනයෙහි ක්‍රියාකාරකම් සම්බන්ධ සමස්ත තීරණ ගැනීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන බවට සභාපතිවරයා විසින් තහවුරු කළ යුතු වේ.
- සභාපතිවරයා විසින් පැහැදිලිව වගකීම් බෙදාහරිමින් බලය සහ අධිකාරීත්වය තුලනය කිරීම සඳහා කටයුතු කළ යුතු වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ආයතනය කාර්යක්ෂමව කළමනාකරණය කෙරෙන බවට තහවුරු කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සම්පත් සුරකිමින්, නිසි පරිදි ගිණුම් පවත්වාගෙන යමින් නිවැරදි වාර්තා සැකසෙන බවට තහවුරු කරන අතර කළමනාකරණය ආශ්‍රිත සියලුම ව්‍යවස්ථාපිත සහ වෙනත් නියාමන අවශ්‍යතා වලට අනුගතව මෙම කාර්යය සිදුකළ යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන කරුණු තහවුරු කළ යුතු වේ:

- ආයතනයෙහි ක්‍රමෝපායික අරමුණු පවතින බව
- අදාළ ක්‍රමෝපායික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා නායකත්වය ලබාදීම
- ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකරණ කණ්ඩායම සතුව අදාළ නිපුණතා, දැනුම සහ ශක්‍යතාවය පවතින බව
- ඵලදායී අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාවේ යෙදවෙන බව

- ආයතනයෙහි කළමනාකරණ ක්‍රියාකාරකම් ඵලදායී අයුරින් අධීක්ෂණය කෙරෙන බව
- කොටස් හිමිකරුවන් හට නිරන්තරයෙන් අවශ්‍ය වන මූල්‍යමය තත්ත්වයන් සහ අනාවරණයන් පිළිබඳ ප්‍රමාණවත් අයුරින් වාර්තා කෙරෙන බව
- සම්පත් සහ වත්කම් ඵලදායී අයුරින් භාවිත කෙරෙන බව
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවක් සහ ඒවැනි වෙනත් කමිටුවක් පත් කළ යුතුය. චර්යාධර්ම සහ හර පද්ධතියක්ද සාමූහික පාලන ක්‍රමෝපායක්ද හඳුන්වාදිය යුතු වේ.
- අදාළ ව්‍යවස්ථාපිත තත්ත්වයන් මාර්ගෝපදේශයන් සහ චක්‍රලේඛ වැනි දෑ සමග ස්වකීය සියලුම ක්‍රියාකාරකම් අනුගත වන බව
- ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අවම වශයෙන් වසරකට වරක්වත් පරීක්ෂා කෙරෙන බව

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී මෙහෙයුම් සහ ප්‍රතිඵල ප්‍රතිපාදන සැලසුම් සහ අදාළ තත්ත්ව සම්මතයන් සමග සසැඳිය යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තරාත්මක අවධානයට ලක් විය යුතු වෙනත් ඕනෑම කරුණක් සමගින් සම්මත ක්‍රියා අනුපිළිවෙලක් අනුගමනය කළ යුතු වේ. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස්වන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ.

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රැස්වීම් 8 ක් පැවැත්වුනු අතර සහභාගී වූවන්ගේ නාම ලේඛණය පහත දැක්වේ ඃ

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී විය | හේතු දක්වන ලදී |
|---|---|---|
| දයා පැල්පොල මයා හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරී (2015/10/20 දින ඉල්ලා අස්විය) | 06 | 0 |
| රොමේෂ් ජයවර්ධන මයා වර්තමාන සභාපති (2015/10/29 දින සිට) | 02 | 0 |
| ආර් අයි විමලසේන මිය උප සභාපති | 08 | 0 |
| වික්‍රම වීරසූරිය මයා අධ්‍යක්ෂ | 08 | 0 |
| ඩී එන් නානායක්කාර මයා අධ්‍යක්ෂ | 08 | 0 |
| එම් එස් ඩී රණසිරි මයා අධ්‍යක්ෂ | 08 | 0 |

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන සහ කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක සුබසාධන කමිටුව
5. ප්‍රචාරණ කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩල සංස්කෘතික හා කලා කටයුතු කමිටුව

## අනුකූලතා නිලධාරී

මණ්ඩලය පාලනය වන්නා වූ නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ නීතිරීති හා රෙගුලාසි වලට අනුගතව කටයුතු කරන බවට තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශ ප්‍රධානි මුදල් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුකූලතා නිලධාරීවරයා නියෝජනය කෙරේ.

## කළමනාකාරීත්වය

මණ්ඩලයෙහි දෛනික මෙහෙයුම් පිළිබඳ වගකීම සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය සතු වේ.

# අවදානම් කළමනාකරණ වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ඵලදායක වූද කාර්යක්ෂම වූද අවදානම් කළමනාකරණ ආකෘතියක් ක්‍රියාවට නැංවේ. එමනිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ක්‍රියාකාරීව අවදානම් කළමනාකරණය සහ ක්‍රමෝපායික අරමුණු සාක්ෂාත් කරගැනීම ආශ්‍රිත අවස්ථාවන් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවදානම් කළමනාකරණය අතිශය වැදගත් වන බවට හඳුනාගැනේ. අවදානම් කළමනාකරණය අදාළ පාර්ශවකරුවන්, කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රතිචාර ලබාදීමේ පද්ධතියක් වශයෙන් ක්‍රියාත්මක වේ. සමාගම ආශ්‍රිත ව්‍යාපාරය, මෙහෙයුම් පද්ධති සහ සේවාවන් වෙත දැනුවත්භවයෙන් යුතු තීරණ ගැනීම සඳහා ඉවහල් වන ක්‍රමෝපායික මධ්‍යස්ථානයක් වශයෙන් එය සුවිශේෂී අයුරින් ස්ථාපනය වී ඇත.

මෙමගින් ක්‍රමෝපායික සහ ව්‍යාපාරික සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණ සහ ව්‍යාපාරික ක්‍රියාවලි මට්ටම් වලදී ව්‍යාපාරික අවදානම් මගහරවා ගැනීම සඳහා අඛණ්ඩ එළඹුමක් සපයනු ලැබේ.

- එමගින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ ඒකකයන් ආවරණය කෙරෙන්නා වූ අවදානම් පිළිබඳව පොදු අවබෝධයක් ලබාදෙයි.

- ප්‍රශස්ත ප්‍රමුඛතා සැකසුමක් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා අනාගතයේදී මුහුණදීමට සිදුවිය හැකි අවදානම් සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වෙත නිරන්තර පරීක්ෂාවක් සපයනු ලැබේ.

- අවදානම් කළමනාකරණය සම්බන්ධ සේවක දැනුවත්භාවය සහ වගකීම වර්ධනය කෙරේ.

## ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) යොදාගනිමින් අවදානම් කළමනාකරණය කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය පහත දැක්වෙන ජාත්‍යන්තර තත්ත්ව සම්මත, අකෘතික රාමුව, දර්ශනය සහ සිද්ධාන්ත මත පදනම්ව ඇත.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ ආකෘතිය පහත දැක්වෙන අරමුණු සමග ක්‍රියාත්මක වේ

1. අභ්‍යන්තරව සැලසුම්ගත වටිනාකම් අකෘතියක් වෙත අනුගත වෙමින් අපගේ ප්‍රතිපත්ති හිමිකරුවන්, කොටස් හිමිකරුවන්, හවුල් ව්‍යාපාර සහකරුවන් සහ අදාළ පාර්ශවකරුවන්ගේ අභිමතයන්හි සුරක්ෂිතතාව තහවුරු කිරීම

2. සදාචාර සම්පන්න වූද සවිමත් වූද සාමූහික පාලන වටපිටාවක් පවත්වා ගෙන යමින් නියාමන අධිකාරීන් විසින් නියම කොට ඇති අදාළ නියාමන මාර්ගෝපදේශයන් වෙත සම්පූර්ණයෙන් අනුගත වන බවට තහවුරු කිරීම

3. අවදානම් අවම කරමින් අවස්ථාවන් උපරිම කරගැනීමේ ඒකායන අරමුණින් යුතුව ක්‍රියාකාරීව අදාළ අවදානම් හඳුනාගැනීම, පරීක්ෂාව, මැනීම, අධීක්ෂණය, කළමනාකරණය සහ වාර්තාකරණය සිදුවන බවට තහවුරු කිරීම

4. අවදානම සහ අවිනිශ්චිතබව ප්‍රායෝගිකව නිරාකරණය කරමින් වඩාත් බුද්ධිමත් තීරණ ගැනීම සඳහා ක්‍රමවත්, ව්‍යුහාත්මක, පැහැදිලි, පරිපූර්ණ හා විශිෂ්ට යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම

5. ඵලදායී ක්‍රියාවලීන් සහ සවිමත් අවදානම් වටපිටාවක් නිර්මාණය කිරීමේදී මානව සහ සංස්කෘතික සාධක සැලකිල්ලට ගනිමින් අවදානම් කළමනාකරණ යනු අදාළ තත්ත්වයන් මත සිදුකළ යුතු යමක් මිස සැමට එකසේ යොදානොගත හැකි බවට තහවුරු කිරීම

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත දැක්වෙන බොහොමයක් වූ අවදානම් වලට මුහුණ පායි.

## තෑගි මුදල් ගෙවීමේ අවදානම

ලොතරැයි තොගවල සෑම මට්ටමකදීම සම්මත තෑගි මුදල් ගෙවීමේ අනුපාතයක් පවත්වාගෙන යා යුතු වේ. මෙහිදී අවදානම වනුයේ සිදුවීම් වල සම්භාවිතාව අනුව තෑගි අනුපාතය ඉහළ යා හැකි අතර එවිට මුදල් ප්‍රවාහ කෙරෙහි බලපෑම් ඇති විය හැකි වීමයි. ඉහත අවදානම ආවරණය කරගැනීම සඳහා මුද්‍රණකරුවන්ගෙන් රක්ෂණාවරණයක්ද ලබාගෙන ඇත.

## ආර්ථික අවදානම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලනික වටපිටාව ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාව කෙරෙහි බලපෑ හැක.

## මූල්‍යමය අවදානම්

මූල්‍යමය අවදානම් අතරට මුදල් ප්‍රවාහ සහ මූල්‍යමය තොරතුරු කාර්යක්ෂමව සහ බලාත්මක අයුරින් කළමනාකරණය නොකිරීම හේතුවෙන් ආයතනයේ තීරණ ගැනීමේ හැකියාව වෙත සිදුවිය හැකි හානිය ඇතුළත් වේ. අවදානම් තුළින් උද්ගත වන මූල්‍යමය බලපෑම ප්‍රමාණවත් රක්ෂණාවරණයක් පවත්වා ගෙන යාම සහ ආයතනය පුරා පිරිවැය පාලන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම වැනි සම්ප්‍රදායික අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ඔස්සේ නිරාකරණය කෙරේ.

## ද්‍රවශීලතා අවදානම

ඉහළ තලයේ තෑගි කලින් ජයග්‍රහණය කිරීම හේතුවෙන් ද්‍රවශීලතා අවදානම මතු විය හැක. එවැනි අවස්ථාවන් සඳහා ඉහළ ද්‍රවශීල වත්කම් පවත්වා ගෙන යනු ලබන බවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය තහවුරු කරයි.

## මෙහෙයුම් අවදානම

ක්‍රියාවලි, තාක්ෂණය සහ මිනිසුන් ආශ්‍රිත මෙහෙයුම් අවදානම යනු පද්ධතිමය දෝෂ, අභ්‍යන්තර පාලනයන් බිඳවැටීම්, මානව දෝෂ සහ සාපරාධී ක්‍රියා ආදිය හේතුවෙන් සිදුවිය හැකි අලාභ සම්බන්ධ අවදානමයි. මැනිය හැකි ගනුදෙනුකාර විශ්වාසය පහළයාම සහ ආයතනික ප්‍රතිරූපය වැනි දෑ සෘජු මූල්‍යමය අලාභයක් තරමටම ආයතනයක් වෙත හානිදායක බව තහවුරු වී ඇත.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දැනට පවතින අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කරමින් හැකි උපරිමයෙන් මෙහෙයුම් අවදානම අවම කරගැනීම සඳහා අඛණ්ඩව කැපවී කටයුතු කරයි. මෙහෙයුම් ඒකකයන්, මහා පරිමාණ ව්‍යාපෘතීන් සහ විශේෂිත ව්‍යාපාරික ක්‍රියාවලීන් ආශ්‍රිත අවදානම පරීක්ෂා කරමින් මෙම ගැටලුව දැනටමත් අර්ධ වශයෙන් නිරාකරණය කොට ඇත.

## කීර්තිනාමය ආශ්‍රිත අවදානම

කීර්තිනාමය ආශ්‍රිත අවදානම යනු ආයතනය කෙරෙහි මහජන විශ්වාසය බිඳවැටීමයි. දෘෂ්‍ය මාධ්‍ය, මහජන අවධානය සහ සමරු කලාප සඳහා උපකාර ඉල්ලා සිටීම් ආදිය මත විශාල වශයෙන් රඳාපැවතීම හේතුවෙන් යම් තරමක අවදානමක් පවතී.

## නෛතික අවදානම

අධිකරණයක සිදුවිය හැකි කල්තබා අනාවැකි පළ කල නොහැකි ගනුදෙනු හෝ මණ්ඩලයට එරෙහිව ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග වලට එරෙහිව සාර්ථකව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් නෛතික අවදානම ඇති විය හැක. මෙවැනි සිදුවීම් ඇති වීම අවම කිරීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂණ පියවර ගෙන ඇති අතර මේ සම්බන්ධයෙන් නීති හා වෙනත් වෘත්තිකයින්ගේ උපදෙස් ලබාගෙන ඇත.

## තොරතුරු තාක්ෂණ අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රධාන පරිගණක පද්ධති වලින් ලැබෙන නිවැරදි හා කාලීන තොරතුරු මත රඳා පවතී. මණ්ඩලයෙහි භාවිත කෙරෙමින් පවතින තොරතුරු යටිතල පහසුකම් නවීකරණයට සහ මෘදුකාංග යාවත්කාලීන කිරීම සඳහා සැලසුම් සකසනු ලැබ ඇත.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව මෙසේ ඉදිරිපත් කෙරේ.

## විගණන කමිටු සංයුතිය

විගණන කමිටුව පහත දැක්වෙන විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| 1. | එම් එස් ඩී රත්නසිරි මයා | විගණන සහ කළමනාකරණ කමිටු සභාපති |
| 2. | ඩී එන් නානායක්කාර මයා | විගණන සහ කළමනාකරණ කමිටු සාමාජික |

රැස්වීමට සහභාගී වීමට නියමිත නිලධාරීන් වනුයේ සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්, අභ්‍යන්තර විගණන නිලධාරී, පරිපාලන නිලධාරී සහ අදාළ සෙසු නිලධාරීන්ය. කමිටුවේ නිරීක්ෂකයකු වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයකු සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්යභාරය

පාර්ශවකරුවන්ගේ අභිමතය සහ මණ්ඩලයේ වත්කම් සුරක්ෂිත කරනු පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සහ අදාළ අධිකාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෙ ්පදේශයන්ද කමිටුව මගින් අනුගමනය කෙරේ. 2015 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වසර තුළ මූලික වගකීම් සම්බන්ධයෙන් කමිටුව මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සාරාංශ වශයෙන් පහත දැක්වේ.

වාර්ෂික මූල්‍යමය ප්‍රකාශයන්හි සුපිළිපන් බව නිරීක්ෂණය කරමින් ඒවා නිකුත් කිරීමට පෙරාතුව එහි ඇතුළත් කැපී පෙනෙන වාර්තාකරණ තීන්දු පිළිබඳව විමර්ශනය කිරීම ඔවුන් අතින් සිදුවිය. මෙයට ගිණුම්කරණ ප්‍රමිතීන්, සටහන් සහ ක්‍රියාකාරකම්, ප්‍රධාන තීරණ ගැනීමේ ක්ෂේත්‍රයන් සහ නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුගත වීම පිළිබඳ විමර්ශනයන් ඇතුළත් විය. විගණන සහ මූල්‍යමය ප්‍රකාශයන්හි හඳුනාගත් කරුණු පිළිබඳව විගණන කමිටුව මගින් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලදී.

අනුමත වාර්ෂික විගණන සැලසුමට අනුව සිදුකෙරෙන ආවර්තිත අන්තර් මධ්‍ය විගණනයන්හි වාර්තා අභ්‍යන්තර විගණකවරයා විසින් භාරදෙනු ලැබේ. අභ්‍යන්තර විගණන වාර්තා මගින් පද්ධති සහ ක්‍රියාවලීන්හි දුර්වලතා හඳුනාගනිමින් පවතින පද්ධති සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා අවැසි නිර්දේශ ඉදිරිපත් කෙරේ. ඒවා ක්‍රියාවට නැංවිය යුතු ආකාරය පිළිබඳව කළමනාකරණ හා විගණන කමිටුවේදී සාකච්ඡාවට භාජනය කෙරේ. විගණන කමිටුව වෙත අභ්‍යන්තර විගණන අංශයෙන් නිරන්තරයෙන් වාර්තා එවනු ලැබේ. කළමනාකාරීත්වයෙහි අදහස්ද එහි කොටසක් වන අතර කමිටුව මගින් විගණන නිරීක්ෂයන්හි හේතුද නැවත දෝෂ සිදුවීම වළක්වාගැනීම සඳහා ක්‍රියාමාර්ගද විමර්ශනය කෙරේ.

අභ්‍යන්තර විගණන අංශයෙහි සහ රජයේ විගණන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කමිටුව මගින් වියදම් සීමා සඳහා අනුමැතිය, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම්, අත්සන් තැබීමේ අධිකාරීත්වයන්, තොරතුරු තාක්ෂණ පාලන සහ සැකසුම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, වෙන්කිරීම් සහ කළමනාකාරීත්වයේ වගකීම් සහ විමර්ශනයන්ද ඇතුළුව මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍යමය පාලන සහ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව පරීක්ෂා කෙරේ. මණ්ඩලයේ මූල්‍යමය ස්ථාවරත්ව වාර්තාවෙහි ද්‍රවශීලතා අනුපාතය නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කෙරිණි. එහිදී හඳුනාගත් දුර්වලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා අවැසි නිර්දේශයන්ද සමග අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරිණි. කමිටුව මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබ ඇති කොප් කමිටු වාර්තා කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි.

## විගණන කමිටුවෙහි රැස්වීම් සංඛ්‍යාව

2015 දී රැස්වීම් පහක් (5) ක් පැවැත්වුනු අතර සහභාගීත්වය පහත දැක්වේ.

| අධ්‍යක්ෂකවරයාගේ නම | පැමිණීම | හේතුව |
|---|---|---|
| එම් එස් ඩී රණසිරි මහතා | 05/05 | නැත |
| ඩී එන් නානායක්කාර මහතා | 05/05 | නැත |

**එම් එස් ඩී රණසිරි මයා**

සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව

# මූල්‍යමය වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. : මිපුආ/ජේ/ඩීඑල්බී/1/15/ගණන්1

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2016 ඔක්තෝබර් 26 දින.

Development Lotteries Board – Vice Chairman – 27 OCT 2016

AGM-(F) [illegible] / AGM (F3)
For necessary action pl / pl Speak
DGM (F)

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය.

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :- ලේකම්, මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } [illegible] | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2016 [illegible] දින. |

සභාපති
සංවිධිත ලොතරැයි මණ්ඩලය.

**සංවිධිත ලොතරැයි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සංවිධිත ලොතරැයි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවිධිත ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා දක්වන කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 ජුනි 17 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්හි ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සංශෝධනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය සංශෝධනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01</u>

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් මණ්ඩලය විසින් බැංකු අයිරා ලෙස හඳුනා නොගත් රු.201,187,108 ක බැර ශේෂය බැංකු ශේෂය සමඟ හිලව්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ii) වර්ෂාන්තයේ රු.934,026,234ක් වූ සාමාන්‍ය සංචිත ගිණුමේ ස්වභාවය හා එහි අරමුණ හෙළිදරව් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07</u>

(i) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදනය රු.8,161,089 ක් හා වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික දීමනා රු.807,934 ක් වෙන් වෙන්ව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම වෙනුවට එය හිලව් කර වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.7,353,155 ක් ලෙස දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී කාරක ප්‍රාග්ධන සංචලනයන් ගැලපීමේදී රු.31,748,430ක ජංගම නොවන වගකීම්වල සංචලනයන් ද ගලපා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08**

2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ආදායම් බදු නොගෙවීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඇති වූ ගිය බදු බැඳියාව රු.1,557,163,004 ක් අතිශාත්‍යයෝජිත මූල්‍ය ප්‍රකාශනවලට නොගැලපීම් හේතුවෙන් පෙර වර්ෂයේදී රු.1,132,035,053 ක්වූ මණ්ඩලයේ හිමිකම් සමාලෝචිත වර්ෂයේදී රු.519,726,031 ක සෘණ අගයක් දක්වා අසාමාන්‍ය ලෙස හීනතාවය වී තිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19**

ප්‍රමිතිය පරිදි සේවක පාරිතෝෂික පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂයන්ට අදාල ආදායම් බදු වෙනුවෙන් මණ්ඩලය විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු. 606,195,948 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපීමෙන් තොරව ජනාධිපති අරමුදලට ගෙවිය යුතු අයක මුදලින් අඩුකර දක්වා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| (i) 18(3) වගන්තිය | අනුමතින් පැවැත්වෙන සංවර්ධන ලොතරැයිවල තෑගි ප්‍රදානය කිරීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවන විට පමණක් තෑගි සංචිත ගිණුමේ මුදල් උපයෝජනය කළ හැකි වුවත් ඊට පටහැනිව මණ්ඩලයේ කාර්යාලය මිලදී ගැනීම හා ගොඩනැගිල්ල අත්පත් කරගැනීම සඳහා තෑගි සංචිත ගිණුමෙන් රු.405,000,000 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි උපයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ii) 19 (1), (2) සහ (3) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාර ලොතරැයි සම්බන්ධයෙන් රීති සකස් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කිරීමෙන් තොරව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් ක්ෂණික ලොතරැයි හා දිනුම් ඇදීමෙන් ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලොතරැයි මගින් රු.10,119,457,760 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණු අතර ඉන් රු.6,150,951,795 ක් ත්‍යාග සඳහා වෙන් කිරීමත් රු.2,146,551,646 ක් අලෙවි නියෝජිත කොමිස් ලබාදීමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **XXIV** වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා 2014 දෙසැම්බර් 09 දිනැති අංක [illegible] දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලිපිය | රජයේ දේපල ණය පිළිබඳව විධිවිධානවලට පටහැනිව නිලධාරීන් 14 දෙනෙකු විසින් ලබාගත් එකතුව රු.9,125,000 ක් වූ පෞද්ගලික බැංකු ණය, දේපල ණය ලෙස සලකා මණ්ඩලය විසින් 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.160,527 ක් හා රු.402,772 ක් වූ පොලී බැංකු වෙත ගෙවා තිබුණි. |
| (ඇ) 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 9.3.1(අ) මාර්ගෝපදේශය | ඉදිරිපත් කර ඇති මිල ගණන්වල සාධාරණත්වය පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් සමාගම් නිෂ්පාදකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් අලුත්වැඩියා කිරීම සිදුකළ හැකි බව දන්වා ඇතත් , මණ්ඩලයේ වාහන අලුත්වැඩියා කිරීම සඳහා අවස්ථා 07 කදී නියෝජිතයන් ඉදිරිපත් කළ මිල ගණන් සමාගම් සලකා රු. 1,321,914 ක අලුත්වැඩියාවන් සිදු කර තිබුණි. |

| | |
|---|---|
| (ii)9.3.1(ආ) මාර්ගෝපදේශය | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේදී රු.200,000 කට වඩා වැඩි අළුත්වැඩියාවන් සඳහා මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එට පටහැනිව අවස්ථා දෙකකදී අළුත්වැඩියා කටයුතු සඳහා රු.853,907 ක් වියදම් කර තිබුණි. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී/28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 නොවැම්බර් 12 දිනැති අංක පීඊඩී/ලේ/පීඊඩී/ලේ/පීඊඩී/2015 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගෙන මාසයකට රු.198,000 ක් බැගින් ගෙවීමට කුලී වාහනයක් ලබාගෙන තිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.12 වගන්ති | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත පමණක් සේවකයන් වෙත රු.12,468,593 ක බෝනස් ගෙවා තිබූ අතර එම වර්ෂයේ තුළ ලාභ ගණනය කිරීමට අදාළ මූල්‍ය ලේඛන නොමැතිව රු.9,713,405 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව හා අනුමත ප්‍රසම්පාදන නොකිරීමේදී මණ්ඩලයේ සභාපති සාමාජිකයින් 06 දෙනෙකු සඳහා කුලී වාහන අනුයුක්ත කර රු.969,890ක ඉන්ධන දීමනා ලබාදී තිබූ අතර එම වාහනවල රියදුරු වැටුප් හා අතිකාල වශයෙන් රු. 2,664,340 ක් ද ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් සඳහා රු.180,746,018ක වියදමක් දරා තිබුණ ද, ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමත කළ වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2003 ජූලි 24 දිනැති අංක 02 දරන ජාතික අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ඉක්මවා සිලින්ඩර ධාරිතාව 2690 ක් වූ වාහනයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. |
| (ඉ) | 2002 සැප්තැම්බර් 11 දිනැති අංක [illegible] දරන ප්‍රතිපත්ති සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබාගැනීමේදී රියදුරු හා ඉන්ධන, මණ්ඩලය විසින් සපයන අවස්ථාවන්හි රක්ෂණ ගෙවීම කිරීම හා අලුත්වැඩියාවන් වාහන සැපයුම්කරු විසින් සිදුකළ යුතු වුවත්, එම විධිවිධාන වලට පටහැනිව එම වියදම් මණ්ඩලය විසින් දැරීමට ගිවිසුම් අත්සන් කර තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,333,259,687 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,353,246,338 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.19,986,651 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම් රු.491,581,670 කින් අඩු වී තිබුණ ද ආදායම රු.511,568,321 කින් අඩුවී තිබීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩ වර්ධනය වී තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අතිරික්තය පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු 2011 වර්ෂයේදී රු.2,056,854,697ක්වූ දායකත්වය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.3,853,950,488 ක් විය.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායිත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

| | | 2015 | 2014 |
|---|---|---|---|
| (i) | දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 43 | 44 |
| (ii) | ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 19 | 19 |
| (iii) | ජංගම අනුපාතය | 1 : 1.6 | 1 : 1.5 |
| (iv) | ක්ෂණික අනුපාතය | 1 : 1.5 | 1 : 1.5 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.396,817,887 කින් එනම් ප්‍රතිශත 3.2 කින් අඩුවී තිබුණ ද විකුණුම් පිරිවැය රු.124,516,322 කින් එනම් ප්‍රතිශත 1.8 කින් පහළයාම දළලාභ අනුපාතය ඒකාකාරීව පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) වෙනත් ආදායම රු.92,519,356 කින් හා නොඉල්ලූ තෑග මුදල් පවරා ගැනීම රු.22,231,080 කින් පහළ ගිය ද ලොතරැයි බෙදාහැරීමේ වියදම ද එට අනුරූපීව රු.93,853,621 කින් පහළයාම ශුද්ධ ලාභ අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යාමට ඉවහල්වී තිබුණි.

(ඇ) මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින අතර සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුකර නොතිබුණි.

### 3.3 මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් බාහිර පුද්ගලයකුගෙන් අයවිය යුතු රු.2,520,000 ක් අයකර ගැනීම සඳහා නඩුවක් පවරා තිබුණද 2015 දෙසැම්බර් 31 දින වනවිට එම අධිකරණ ක්‍රියාමාර්ග නිමා වී නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

(i) ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ ඒ සඳහා කටයුතු කිරීම.

(ii) එසේ ලැබෙන අරමුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලොතරැයිපත් 8 ක් පවත්වා රු.මිලියන 1,727 ක් උපයා ඉන් රු.මිලියන 1,628 ක් ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ආ) ලොතරැයිපත් අලෙවිය හා ප්‍රචාරණ වියදම සැසඳීම

| ලොතරැයියේ නම | විකුණුම් ආදායම | | | | ප්‍රචාරණ වියදම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | විචලනය | ප්‍රතිශතය | 2014 | 2015 | විචලනය | ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | % | රු. | රු. | රු. | % |
| සුපිරි වාසනාව | 2,007,008,025 | 2,096,216,100 | 89,208,075 | 4.44 | 7,791,985 | 26,927,823 | 19,135,838 | 245.58 |
| සංවර්ධන / ලග්න වාසනාව | 2,492,645,100 | 2,424,568,575 | (68,076,525) | (2.73) | 27,736,856 | 30,233,422 | 2,496,566 | 9.00 |
| ජයෝදා | 1,255,317,525 | 1,174,951,800 | (80,365,725) | (6.40) | 26,562,805 | 24,484,608 | (2,078,197) | (7.82) |
| ශනිදා / කෝටිපති ශනිදා | 854,071,350 | 906,953,850 | 52,882,500 | 6.19 | 10,795,645 | 27,748,445 | (16,952,800) | 157.03 |
| ජීවන ධන | 1,025,266,275 | 970,588,575 | (54,677,700) | (5.33) | 24,502,245 | 26,113,147 | 1,610,902 | 6.57 |
| සුපර් බෝල් | 2,314,937,625 | 2,082,186,975 | (232,750,650) | (10.05) | 39,286,399 | 30,310,818 | (8,975,581) | (22.85) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සතිපතා වාසනා හා ජයෝදය / ලැලැක්ෂ ජයාඩ් යන ලොතරැයි දෙකේ ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 246 කින් හා සියයට 157 කින් වැඩිවීමට සාපේක්ෂව විකුණුම් ආදායම වර්ධනය වී තිබුණේ සියයට 4 ක හා සියයට 6 ක අඩු ප්‍රතිශතයකිනි.

(ii) නියත ජය ලොතරැයියේ ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 6.57 කින් වැඩි වුවද, විකුණුම් ආදායම සියයට 5.33 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

(iii) සුපර් බෝල් ලොතරැයියේ විකුණුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 10.05 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

(iv) සංවර්ධන/ ලග්න වාසනා ලොතරැයියේ ප්‍රචාරණ වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 9 කින් වැඩි වුව ද , විකුණුම් ආදායම සියයට 2.73 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී බදු ගෙවීම පැහැර හැර තිබීම නිසා ඇති වූ හිඟ බදු මුදල් පියවීම සඳහා ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.131,270,475 ක් වූ ස්ථාවර තැන්පතු ආයෝජන අවලංගු කර මුදල් ආපසු ලබාගැනීම නිසා ලැබිය යුතුව තිබූ පොලී ආදායම රු.4,815,246 ක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ආ) අලෙවි ප්‍රවර්ධනය සඳහා ණය පදනම මත ටිකට් පත් නිකුත් කිරීමේදී මිලදී ගනු ලබන ටිකට් පත් 25 කට එකක් බැගින් නොමිලේ ලබාදීමට තීරණය කර තිබුණු අතර ටිකට් පත් දෙකක් සඳහා දිනුම් වාර 13 කට අදාළව මෙම ප්‍රතිපත්ති වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට පෙර තත්ත්වය හා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු තත්ත්වය සංසන්දනයේදී ටිකට් පොත් 42,227 ක අලෙවිය අඩුවීමක් සිදු වී තිබුණි. ඒ අනුව නොමිලේ නිකුත්කළ ටිකට් පොත් 130 ක වටිනාකම වූ රු.107,250 ක් ඵල රහිත වියදමක් ද යන්න විගණනයේදී මගහැර කළ නොහැක.

(ඇ) ලොතරැයි දිනුම් ඇදීමේ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව 2009 වර්ෂයේදී සැපයුම්කරුවෙකු තෝරාගෙන 2014 අගෝස්තු 31 දින දක්වා සේවා සැපයීමට එළඹ තිබුණු නමුත් එදින සිට 2016 අගෝස්තු 31 දක්වා දින දීර්ඝ කිරීම් දෙකක් ලබා දී අදාළ සමාගමට රු.81,997,776 ක් ගෙවීම් කර තිබුණ ද 2016 ජූලි 13 දින වනවිටත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

මණ්ඩලය විසින් සතිපතා දිනුම් අදිනු ලබන වර්ගයකට රු.862,918,650 ක් වූ ලොතරැයිපත් 52,298,100 ක් 2015 අප්‍රේල් 01 දින සිට 2016 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඇපයක් / ප්‍රතිරක්ෂණයක් ලබාගැනීමකින් තොරව ණය පදනම මත අලෙවි කර තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලග්න වාසනා ලොතරැයිපත් අලෙවි ප්‍රවර්ධනය සඳහා ලග්න වාසනා ලාංඡනය සහිත කුඩ 700 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.308,000 ක් වැය කර තිබුණ ද කුඩ සැපයුම්කරුගේ වෙළඳ ලාංඡනය සහිත කුඩ බෙදා හැර තිබූ බැවින් එම ගනුදෙනුව තුළින් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

(ආ) 2008 අප්‍රේල් 22 දින මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබුණ රු.8,095,000 ක් වටිනා ඩබල්කැබ් රථය ඊට පෙර සිටි සභාපතිවරයා විසින් සැපයුම්කරු සමාගමෙන් භාර ගෙන තිබුණ බව අනාවරණය විය. නමුත් එම රථය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විට ද මණ්ඩලය වෙත භාර දී නොතිබුණ අතර විගණනයේදී එහි භෞතික පැවැත්ම තහවුරු කිරීමට ආයතනය අපොහොසත් විය. කෙසේ වුවද මෙම මෝටර් රථය මණ්ඩලයේ වත්කමක් ලෙස සලකා ගිණුම්ගතකර තිබූ අතර එයට අදාළ වටිනාකම වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ බැරකමක් ලෙස දක්වා තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝගීත වත්කම්**

මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී රු.38,752,448 ක් වැය කර ලොතරැයි දිනුම් ඇදීම් රූපගත කිරීම සඳහා චිත්‍රාගාරයක් ඉදිකර තිබුණද අදාළ කාර්යය සඳහා එම චිත්‍රාගාරය භාවිතා කර නොතිබුණ අතර චිත්‍රාගාරයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අධ්‍යයනය කර රූපවාහිනී සංස්ථාව මගින් 2012 ජුනි මාසයේදී ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද මණ්ඩලය කටයුතු කර නොතිබුණි. ඒ අනුව, මණ්ඩලය සතු චිත්‍රාගාරය භාවිතා නොකර ලොතරැයි දිනුම් ඇදීම ජාතික රූපවාහිනී සංස්ථාව මගින් ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.36,850,000 ක් ජාතික රූපවාහිනී සංස්ථාව වෙත ගෙවා තිබුණු අතර මණ්ඩලයේ චිත්‍රාගාරය මණ්ඩලයේ දේශන ශාලාවක් ලෙස භාවිතා කර තිබුණි.

**4.6 [illegible] ලද හානි**

විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොකිරීම හා, නියමිත කාලසටහනක් තුළදී ලොතරැයිපත් මුද්‍රණය සඳහා නිවැසුම් වලට එළඹ නොකිරීම හේතුවෙන් මුද්‍රණ කටයුතුවලින් මණ්ඩලයට රු.6,093,297 ක අලාභයක් සිදුවී තිබුණි.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**

ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ඇති කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.3,472,393 ක් වැයකර තිබුණ ද , පසුව එම කාර්යය අවලංගු කර තිබූ බැවින් මෙම වියදම නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

අනුමත කාර්ය මණ්ඩලය 221 ක් වුවද, සත්‍ය කාර්ය මණ්ඩලය 238ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 19 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 36 ක් විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ කාර්යසාධන වාර්තා හෝ ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු බැවින් 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක වලට මණ්ඩලය ළඟා වී ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී අයවැයගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 94 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාර්යයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම.

සංවර්ධන ලොතරැයි ත්‍යාග ලාභීන්ගෙන් ඇතැම් වර්ෂයකම ත්‍යාග වටිනාකමින් සියයට 4 කට ආසන්න ප්‍රමාණයක් සඳහා හිමිකම් පෑමට ඉදිරිපත් නොවන බවත් අනුව වසර 5 තුළදී මෙසේ හිමිකම් නොපෑ වටිනාකම රු.1,103,636,625 ක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් තුළ හිමිකම් නොපෑ ලොතරැයිවලින් අනුව රු.50,000 සිට රු. 1,000,000 දක්වා වූ ලොතරැයි 49 ක් විය. ජයග්‍රාහකයන් වෙත අදාළ ජයග්‍රහණයන් ලබා දීමෙන් මහජන විශ්වාසය ගොඩනැගීමත් මණ්ඩලයේ කීර්තිනාමය ඉහළ තත්ත්වයකට ගෙන ඒමටත් හැකිවන බැවින් ත්‍යාග සඳහා හිමිකම් නොපෑම අවම කිරීම සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | මණ්ඩලයේ බදු, ගෙවිය යුතු තැනය අයිතම් ගිණුම්වල හඳුනානොගැනීම හා හෙළිදරව් නොකිරීම සහ පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත සේවක සංඛ්‍යාවට අමතරව [illegible] සේවක මණ්ඩලයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබීම. |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකරණය | මණ්ඩලයේ ව්‍යාපාර සම්බන්ධයෙන් ශක්‍යතා පරීක්ෂණයක් සිදු කිරීමේ වැඩ පිළිවෙලක් සකස් වී නොතිබීම. |
| (ඈ) | භාණ්ඩ පාලනය | භාණ්ඩ ලේඛන නිසි පරිදි පවත්වා නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | **11,874,659,603** | 12,271,477,490 |
| ටිකට්පත් පිරිවැය | 02 | **325,360,130** | 378,157,596 |
| ගෙවන ලද තෑගි මුදල් | 03 | **6,150,951,795** | 6,211,302,790 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | **261,133,229** | 272,501,090 |
| **දළ ලාභය** | | **5,137,214,449** | 5,409,516,014 |
| වෙනත් ආදායම් | 05 | **58,146,101** | 150,665,457 |
| බෙදාහැරීමේ පිරිවැය | 06 | **2,728,440,701** | 3,067,688,297 |
| පරිපාලන වියදම් | 07 | **332,597,185** | 347,408,024 |
| **මෙහෙයුම් වියදම් වලට පසු අතිරික්තය** | | **2,134,322,664** | 2,145,085,149 |
| මූල්‍ය පිරිවැය | 08 | **260,350** | 647,572 |
| ත්‍යාග නැවත ගැනීම් | | **255,554,300** | 277,785,380 |
| **බදු පෙර ලාභය** | | **2,389,616,614** | 2,422,222,956 |
| ආදායම් බදු | | **56,356,927** | 68,976,618 |
| **ආදායම් බදු වලට පසු ලාභය** | 09 | **2,333,259,687** | 2,353,246,338 |

ගිණුම්කරණ ප්‍රමිති සහ සටහන් මගින් මූල්‍යමය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය වේ මෙම මූල්‍යමය ප්‍රකාශයන් සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ, මෙම මූල්‍යමය ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කොට අත්සන් තබන ලදී.

**ඩබ්ලිව් ඒ වී සී සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**රොමේෂ් ජයවර්ධන**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ආර් අයි විමලසේන**
උප සභාපති

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| 2015 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **වර්තමාන නොවන වත්කම්** | 10 | | |
| දේපළ පිරියත සහ උපකරණ | | **728,776,741** | 707,938,513 |
| නොනිමි ප්‍රාග්ධනය | | **1,583,595** | 1,336,676 |
| | | **730,360,335** | 709,275,189 |
| කල්පිරීම තෙක් රඳවාගත් වත්කම් | 11 | **807,514,816** | 885,551,607 |
| | | **807,514,816** | 885,551,607 |
| **මුළු වර්තමාන නොවන වත්කම්** | | **1,537,875,151** | 1,594,826,796 |
| | | | |
| **වර්තමාන වත්කම්** | | | |
| තොග | 12 | **32,603,696** | 43,580,565 |
| වාණිජ ණයගැතියන් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 13 | **35,401,941** | 34,126,920 |
| පෙරදායකවීම් සහ තැන්පතු | 14 | **5,631,264** | 14,993,931 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15 | **338,946,957** | 249,562,916 |
| මුළු වර්තමාන වත්කම් | | **412,583,859** | 342,264,333 |
| **මුළු වත්කම්** | | **1,950,459,010** | 1,937,091,128 |
| | | | |
| **ස්කන්ධ සහ වගකීම්** | | | |
| **දායකත්ව ප්‍රාග්ධනය** | | | |
| ජනාධිපති අරමුදල | | **2,200,000** | 2,200,000 |
| මහපොළ භාර අරමුදල | | **2,200,000** | 2,200,000 |
| තෑගි සංචිත ගිණුම | | **934,026,234** | 877,036,186 |
| ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු මුදල් | | **99,010,739** | 250,598,866 |
| පැහැර හරින ලද බදු වගකීම් | | **(1,557,163,004)** | |
| **මුළු ස්කන්ධ** | | **(519,726,031)** | 1,132,035,053 |
| | | | |
| **වර්තමාන නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 16 | **30,303,482** | 22,950,327 |
| අලෙවි නියෝජිත හා බෙදාහරින්නන් වෙත ගෙවිය යුතු තැන්පතු | 17 | **28,380,381** | 27,314,881 |
| ගෙවිය යුතු ණය වව්චර | | **203,705,730** | 173,022,800 |
| හරින ලද බදු සඳහා වෙන් කිරීම | | **1,557,163,004** | |
| මුළු වර්තමාන නොවන වගකීම් | | **1,819,552,597** | 223,288,008 |
| | | | |
| **වර්තමාන වගකීම්** | | | |
| වාණිජ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 18 | **441,763,122** | 344,061,901 |
| ගෙවිය යුතු තෑගි මුදල් | 19 | **208,869,321** | 237,706,166 |
| මුළු වර්තමාන වගකීම් | | **650,632,443** | 581,768,068 |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **1,950,459,010** | 1,937,091,128 |

ගිණුම්කරණ ප්‍රමිති සහ සටහන් මගින් මූල්‍යමය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය වේ මෙම මූල්‍යමය ප්‍රකාශයන් සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ මෙම මූල්‍යමය ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කොට අත්සන් තබන ලදී.

**ඩබ්ලිව් ඒ වී සී සෝමරත්න**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**රොමේෂ් ජයවර්ධන**

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ආර් අයි විමලසේන**

උප සභාපති

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 2,389,616,614 | 2,422,222,956 |
| **ගැළපුම්** | | | |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම | | 44,154,780 | 34,968,392 |
| ත්‍යාග සංචිත ගිණුම | | 56,990,048 | 100,168,320 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | | 7,353,155 | 14,003,961 |
| පොලී ආදායම | | (47,400,187) | (136,238,335) |
| පරිගණක යන්ත්‍ර විකිණීමෙන් ලද ආදායම | | (126,000) | |
| ගෙවන ලද ආදායම් බදු | | (51,732,464) | |
| ගෙවන ලද පූර්ව ආදායම් බදු | | (641,843,494) | (479,453,042) |
| ජනාධිපති අරමුදල වෙත ගෙවීම් | | (1,825,912,341) | (1,950,526,200) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | (68,899,889) | 5,146,053 |
| **මෙහෙයුම් වත්කම් ඉහළයාම/ පහළ යාම** | | | |
| තොග පහළයාම | | 10,976,869 | 93,960,527 |
| ණය ගැතියන් ඉහළයාම/පහළයාම | | (1,275,021) | 803,486 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් වල පහළ යාම | | 9,362,667 | (3,762,403) |
| **මෙහෙයුම් වගකීම් වල ඉහළයාම/ පහළයාම** | | | |
| ණයහිමියන්ගේ ඉහළයාම | | 75,984,777 | (247,319,760) |
| ගෙවිය යුතු ත්‍යාග මිල පහළයාම | | (28,836,845) | (273,736,900) |
| ණය වව්වර වල ඉහළයාම | | 30,682,930 | (22,746,860) |
| බෙදාහරින්නන්ගේ තැන්පතු වල ඉහළයාම | | 1,065,500 | (544,500) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 29,060,989 | (448,200,357) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | | |
| ස්ථාවර වත්කම් (දේපළ පිරියත සහ උපකරණ) | | (65,239,926) | (27,639,910) |
| පරිගණක යන්ත්‍ර අලෙවියෙන් ලද මුදල් | | 126,000 | |
| පොලී ආදායම | | 47,400,187 | 136,238,335 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | | 78,036,791 | 131,279,899 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල්** | | 60,323,052 | 239,878,324 |
| | | 89,384,041 | (208,322,034) |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ ඉහළයාම/පහළයාම | | 89,384,041 | (208,322,034) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | 249,562,916 | 457,884,949 |
| වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 338,946,957 | 249,562,916 |
| බැංකුවල පවතින මුදල් ලංකා බැංකුව | | 243,899,107 | 220,208,174 |
| මහජන බැංකුව | | 70,099,656 | 21,206,119 |
| සම්පත් බැංකුව | | 24,918,790 | 8,099,220 |
| අත ඇති මුදල් | | 29,404 | 49,404 |
| | | 338,946,957 | 249,562,916 |

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | ජනාධිපති අරමුදල සහ මහපොළ භාර අරමුදල<br>රු. | තෑගි සංචිත ගිණුම<br>රු. | රඳවාගත් ඉපැයුම්<br>රු. | පැහැර හරින ලද බදු වගකීම<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| 01.01.2014 දිනට ශේෂය | 4,400,000 | 776,867,866 | | | 781,267,866 |
| වසර තුළදී එකතු කිරීම් | | 100,168,320 | 2,353,246,338 | | 2,453,414,658 |
| ජනාධිපති අරමුදල වෙත ගැලපුම් | | | (1,834,814,000) | | (1,834,814,000) |
| ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු මුදල් මාරුකිරීම | | | 17,063,341 | | 17,063,341 |
| පෙර වසරේ ගැළපුම් | | | (284,896,813) | | (284,896,813) |
| 31.12.2014 දිනට ශේෂය | 4,400,000 | 877,036,186 | 250,598,866 | | 1,132,035,053 |
| | | | | | |
| වසර තුළදී එකතු කිරීම් | | 56,990,048 | 2,333,259,687 | (1,557,163,004) | 833,086,731 |
| පෙර වසරේ ගැලපුම් | | | (606,195,948) | | (606,195,948) |
| ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු මුදල් මාරුකිරීම | | | (1,628,053,000) | | (1,628,053,000) |
| 31.12.2015 දිනට ශේෂය | 4,400,000 | 934,026,234 | 99,010,739 | (1,557,163,004) | (519,726,031) |

# මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

## 1. වාර්තා කරනු ලබන ආයතනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාපිතය මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත , යුනියන් පෙදෙස, කොළඹ 02 වේ

වසර තුළදී මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම වූයේ ලොතරැයි පත් අලෙවියයි.

## 2. සැකසීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

මින් ඉදිරියට (ශ්‍රීලමූවාප්‍ර/ලගිප්‍ර) නමින් හැඳින්වෙන ශ්‍රී ලංකා රජයේ මූල්‍ය රෙගුලාසි සහ පරිපාලන රෙගුලාසි අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කොට ඇති නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍යමය ප්‍රකාශ සකසනු ලැබ ඇත.

### 2.2. මිණුම්කරණ පදනම

පහත දක්වා ඇති අවස්ථාවන්හි හැරුනු කොට මූල්‍යමය ප්‍රතිඵල ඓතිහාසික පිරිවැය පදනම මත සකසනු ලැබ ඇත.

| | |
|---|---|
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | සාධාරණ අගය |
| ඉඩම් සහ ගොඩනැගිලි | ප්‍රත්‍යාගණන ප්‍රමාණයන් |
| පාරිතෝෂික වෙන්කිරීම | පාරිතෝෂික සැකසුම සහ ගණනය කිරීම නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගය මත සිදුකෙරේ |

### 2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

